# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**




**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

කතෝලික ධර්මය

6 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: .....................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

විෂය සම්බන්ධීකරණය :
- ගරු කාල්ටන් ද සිල්වා පියතුමා
  කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ගරු රෙක්ස් කොන්ස්ටන්ටයින් පියතුමා
  සහකාර ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය

ලේඛක මණ්ඩලය :

- ශාස්ත්‍රපති ගරු ජූඩ් දසනායක පියතුමා, (කථිකාචාර්ය, බිංගිරිය විද්‍යා පීඨය)
- ශාස්ත්‍රපති එස්. ජී. කේ. ඩී. එල්. සී. ප්‍රසාද් මහතා
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම)
- දුෂ්මන්ති ද සිල්වා මෙනෙවිය (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මිනුවන්ගොඩ)
- ඩී. අයි. ජෝසප් මෙනෙවිය (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ)
- ශාස්ත්‍රවේදී ටී.අයි. රන්ගනායගම් මහතා
  (ගුරුසේවය - ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය, කොළඹ 03)
- ඒන්ජල් මේරි මෙනෙවිය (ගුරුසේවය -ශාන්ත අන්තෝනි දෙමළ විද්‍යාලය, කොළඹ 14)
- ඩබ්. කේ. එම්. අයි. එස්. කේ. ප්‍රනාන්දු මහත්මිය (විශ්‍රාමික ගුරු උපදේශිකා)
- ශාස්ත්‍රවේදී ටී. ජේ. පෝල් ඇන්තනි මහත්මිය (විශ්‍රාමික විදුහල්පතිනිය)
- ශාස්ත්‍රවේදී එන්. එෆ්. රාජයෝගිනි මෙනෙවිය
  (ගුරුසේවය - සියලු සාන්තුවරයින්ගේ බාලිකා විද්‍යාලය, කොළඹ 10)

කතෝලික උපදේශක මණ්ඩලය :

- අති උතුම් මැක්ස්වෙල් සිල්වා රදගුරුතුමා
  සභාපති - අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අති උතුම් ජෝශප් පොන්නයියා රදගුරුතුමා
  උපසභාපති - අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිගරු අයිවන් පෙරේරා පියතුමා කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා බයිබල් හා ධර්මෝපදේශ පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ආචාර්ය ගරු හෙන්රි සිල්වා පියතුමා කථිකාචාර්ය, ක්‍රිස්තියානි සංස්කෘතික දෙපාර්තමේන්තුව, කැලණිය විශ්වවිද්‍යාලය
- ආචාර්ය ගරු ඥාණමුත්තු හෙක්ටර් පිලේන්ද්‍රන් පියතුමා ප්‍රධානි - බටහිර සම්භාව්‍ය සංස්කෘතික හා ක්‍රිස්තියානි හා ඉස්ලාමීය සංස්කෘතික දෙපාර්තමේන්තුව, යාපනය විශ්ව විද්‍යාලය
- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා සහකාර අධ්‍යක්ෂ - ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවාගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබා ගැනීම පමණක් නොසෑහේ. හිස පමණක් පෝෂණය කරන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකිය. අධ්‍යාපනය තුළින් හදවත හා අත ද පෝෂණය කළ යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය පෙළ පොතට හා විෂය නිර්දේශයට අනුරූපව ලියා ඇත. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතුය.

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාදෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකිය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදුකළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතුය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස්කර ගන්න. ඇගයීම් සිදුකිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ කල්වේලාසන සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදුකිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විද්‍යුත්පත්‍රිකා මඟින් ද , විෂය භාර ගුරු භවතා පංති කවවලදී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතුය.

**කථිකාචාර්ය, කාල්ටන් ද සිල්වා පියතුමා**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශය | vi – xxii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 – 75 |
| විවිධ සහාය | 76 |

# විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

ආගම යනු ජීවිතයයි. එහෙයින් ජීවිතයෙන් ආගම වෙන් කළ නොහැකිය. සෑම ආගමකම පරමාර්ථය සදාචාරසම්පන්න ගුණගරුක සමාජයක් ගොඩ නැගීමයි. එම අරමුණත් පෙරදැරි කරගෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අතර එහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ සිසුන් තුළ නිපුණතා ගොඩනැගීමයි. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී කරගත් ජීවිත පුරුද්දකි. අධ්‍යාපන දාර්ශනිකයන් අන්තර් පුද්ගල හැකියා යනුවෙන් අර්ථ දක්වනුයේ වෙන කිසිවක් නොව කිතුණු අප "ප්‍රේමය" යනුවෙන් හඳුන්වනු ලබන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මූලික ඉගැන්වීමයි. එබැවින් උත්තම ගුරු දේවයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා, කිතුණු ආකල්ප සංවර්ධනය කරගෙන, කුසලතා වලින් පරිපූර්ණ වී, ප්‍රේමය මත ගොඩනැගුණු ජීවිත පුරුද්දක් ඇති කිරීම කතෝලික විෂයෙහි මෙම නව සංස්කරණ මඟින් ඉලක්ක කෙරේ.

කිතුණු ඉගැන්වීම්වල පදනම ශුද්ධ බයිබලයයි. මන්ද යත් කිතුණු විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය ශුද්ධ බයිබලීය ඉගැන්වීම් මත පදනම් වී ඇත. එබැවින් මෙම කතෝලික විෂය නිර්දේශයෙහි පළමු තේමාව වන්නේ ශුද්ධ බයිබලයයි. තවද භාග්‍යවත් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් නිර්දේශිත විශේෂ කමිටුවක් විසින් සම්පාදනය කරනු ලැබූ "කතෝලික සභාවේ ධර්මෝපදේශය" (Catechism of the Catholic Church) නමැති ග්‍රන්ථයෙහි තේමාවන්ට අනුකූලව ඉතිරි තේමා 4 ගොනුකර ඇත. ඒ අනුව මෙම විෂය නිර්දේශයේ පහත සඳහන් තේමා පහ ඇතුළත් කර ඇත.

1. ශුද්ධ බයිබලය
2. ත්‍රිත්වික දෙවියන් වහන්සේ
3. විශ්වාසයේ ජීවිතයට ශක්තිය
4. විශ්වාසයේ ජීවිතය ක්‍රියාත්මක කිරීම
5. යාච්ඤාවේ ජීවිතය

එම තේමා පහ අනුව නිපුණතා පහක් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා විෂය නිර්දේශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

කතෝලික විෂය නිර්දේශයේ දක්වා ඇති නිපුණතා සාක්ෂාත් කර ගනිමින් අනාගතයේ දී වැඩිහිටි කතෝලික නිපුණයෙකු ලෙස ක්‍රියාකාරී වීමට වර්තමාන දරුවා ගොඩනැගීම අවශ්‍ය වේ. ඒ සඳහා 6-9 ශ්‍රේණිවල දී මූලික ජීවිත පුරුද්දක් ඇති කර 10-11 ශ්‍රේණිවල දී පූර්ණ කතෝලික බැතිමතෙකු ලෙස තිබිය යුතු නිපුණතා ගොඩනැගීම මෙයින් අපේක්ෂා කෙරේ. මන්ද 12- 13 ශ්‍රේණිවල කලා විෂය ධාරාවෙන් ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය තෝරා ගන්නා අතළොස්සක් හැර ඉතිරි කතෝලික බහුතරයේ ආගමික දැනුම අ.පො.ස. (සා/පෙළ) විෂය නිර්දේශයට බොහෝවිට සීමා වන බැවිනි.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින්, අදාළ නිපුණතා සිසුන් තුළ ගොඩනැගීමට ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම, සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරන ගුරුවරයාගේ වගකීමයි.

ආගම විෂය උගන්වන ගුරුවරයා විශේෂයෙන් එම ධර්මතා පිළිඹිබු කරන කැඩපතක් විය යුතු ය. එහෙයින් පළමුව ගුරුවරයා සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන, ආගමික සංකල්ප තමන් තුළ ප්‍රගුණ කරගත් පුද්ගලයෙකු බව ශිෂ්‍යයාට අවබෝධ විය යුතුය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

1. තම ජීවිතය ගොඩනගා ගැනීමට ශුද්ධ බයිබලය පිටිවහලක් කර ගනියි.

2. මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයාගේ මැවුම්කරුවාණන්, දෙවියන් වහන්සේ බව හඳුනා ගනියි.

3. ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිනත කිතුණු ජීවිතයක් ගත කරයි.

4. දේව වාක්‍යය, ප්‍රසාද නිධාන හා ජනවන්දනාව තුළින් පෝෂණය ලබා සමාජය තුළ සාක්ෂි දරයි.

5. ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනියි.

6. දේව පණත් හා කන්ද උඩ දේශනය තුළ ගැබ්ව ඇති කිතුණු සදාචාරමය ඉගැන්වීම් පදනම් කරගෙන ජීවත් වෙයි.

7. යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී දේව වරප්‍රසාද අත්දකියි.

8. ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට ක්‍රියා කරයි.

9. තමා අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේ ගෙන් ලද තිළිණයක් බව පිළිගෙන එය සුරැකීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කරගනියි.

10. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගන අතර, කිතුණු අනන්‍යතාවය තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහිකරලීමට දායක වෙයි.

11. කිතුණු විශ්වාසය රැක ගනිමින්, සෑම ආගමකටම ගරු කිරීමට පුරුදු වෙයි.

12. ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කර ගනියි.

# විෂය අදාළ නිපුණතා

1. ශුද්ධ බයිබලය පිළිබඳව අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේදී ඵලදායීව භාවිත කරයි.

2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

3. දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී පූර්ණ කිතුණු ජීවිතයකට සාක්ෂි දරයි.

4. දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

5. යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි. | 6.1.1 ශුද්ධ බයිබලයේ ග්‍රන්ථය නිවැරදිව පෙරළයි. | **1 පාඩම - ශුද්ධ බයිබලය**<br>• කෙටි හැඳින්වීම<br>• ශුද්ධ බයිබලය යනු කුමක්ද ?<br>• කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය<br>• කොටස් දෙකකි.<br>• පුරාණ ගිවිසුම 46 - නව ගිවිසුම 27<br>• පොත් නාමාවලිය | • ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් දෙකට අයත් පොත් වෙන වෙනම ගොනු කරයි.<br>• ශුද්ධ බයිබලය නිවසේ ගෞරවාන්විත ව වැඩම කර තැබිය හැකි ආකාර පිළිබඳ යෝජනා ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ බයිබලයේ පොත් නිවැරදිව ක්ෂණික ව පෙරළයි.<br>• ශුද්ධ බයිබලය ගෞරවයෙන් භාවිත කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය ලබා දෙයි. | 02 |
| | 6.1.2 පංච පුස්තකය උනන්දුවෙන් භාවිත කරයි. | **2 පාඩම - පංච පුස්තකය**<br>• පංච පුස්තකයට අයත් පොත් පහ නම් කිරීම හා හැඳින්වීම (හඳුන්වන වෙනත් නම් ද ඇතුලත්ව)<br>• උත්පත්ති පොතේ හා නික්මයාම පොතේ අන්තර්ගතය පිළිබඳ කෙටි හැඳින්වීමක් | • පංච පුස්තකය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දැක්විය යුතු බව පිළිගනියි.<br>• පංච පුස්තකය පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරයි.<br>• පංච පුස්තකය කියවීමට ආශාවක් ඇති කර ගනියි.<br>• කණ්ඩායම් තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි. | 02 |
| | 6.1.3 ශුභාරංචි පිළිබඳව අධ්‍යයනය කරයි. | **3 පාඩම - ශුභාරංචි**<br>• ශුභාරංචි නම් කිරීම<br>• කතෘවරු හතර දෙනා පිළිබඳ කෙටි හැඳින්වීම<br>• ශුභාරංචි හතරෙහි සංකේත | • සුබාරංචි හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• අප එක් එක්නෙකා අන් අයට සුබාරංචියක් විය යුතු බව පිළිගනියි.<br>• සුබාරංචි පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරිමක් එළිදක්වයි.<br>• සුබාරංචි එදිනෙදා ජීවිතය තුළ පරිහරණය කරයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකරකම්වල නිරත වේ. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි. | 6.2.1 දේව මැවිල්ල අගය කරයි. | **4 පාඩම - ලෝකය මැවීමේ පුවත**<br>• එක් එක් දිනයේ මැවිලි (මැවීමේ පළමු කතාව - උත්පත්ති 1/1-2/4අ)<br>• දේව මැවිල්ල අගය කිරීම (ගීතාවලිය - 104) | • මැවීම පිළිබඳ පළමු කතාවේ එක් එක් දිනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව පිළිගනියි.<br>• එක් එක් දිනයේ දේව මැවිලි නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව මැවිල්ල අගය කරයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 02 |
| | 6.2.2 දේව මැවිල්ල ආරක්ෂා කරමින් දෙවියන් වහන්සේට තුති පුදයි. | **5 පාඩම - විවිධාකාර දේව මැවිල්ල**<br>• දේව මැවිල්ලේ ප්‍රයෝජන, ඒවාට තුති පිදීම හා දේව මැවිල්ල ආරක්ෂා කිරීම ( උත්පත්ති 1/28-29 හා 2/15) | • මැවිල්ල ආරක්ෂා කිරීමට කළ යුතු දේවල් ගොනු කරයි.<br>• දේව මැවිල්ල ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.<br>• දේව මැවිල්ල ආරක්ෂා කිරීමට මිනිසා අපොහොසත් වී ඇති ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• මැවිල්ල ආරක්ෂා කිරීමට ඉදිරිපත් වෙයි.<br>• පාසල් පරිසරය අලංකාර කිරීමට එකමුතු වී, සහයෝගයෙන් වැඩ කරයි. | 02 |
| | 6.2.3 එකිනෙකට ගරු කරමින් සාමයෙන් හා සහයෝග-යෙන් ජීවත් වෙයි. | **6 පාඩම - උතුම් ම දේව මැවිල්ල**<br>• උතුම් ම දේව මැවිල්ල වූ මිනිසා<br>• දේව ස්වරූපය හා සමානකම (උත්පත්ති 1/27 - 28)<br>• ජීවන හුස්ම හෙළීම (උත්පත්ති 2/7)<br>• ඉතා යහපත් (ඉතා මනහර) බව ප්‍රකාශ කිරීම<br>6 වන දවස (උත්පත්ති 1/31)<br>• මිනිසා සතුන්ව නම් කිරීම (උත්පත්ති 2/20)<br>• පුද්ගල විවිධත්වය හා එකිනෙකාට ගරු කිරීම උත්පත්ති 2/21 - 23) | • මිනිසාගේ උතුම්කම විදහා පාන කරුණු ගොනු කරයි.<br>• පුද්ගල විවිධත්වයට ගරු කළ යුතු බව පිළිගනියි.<br>• මිනිසාගේ උතුම්කම නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>• එකිනෙකාට ගරු කරමින් සහයෝග-යෙන් හා සමගියෙන් ජීවත්වීමට පියවර ගනියි.<br>• අන් මතවලට ඇහුම්කන් දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2.4 එදිනෙදා ජීවිතය තුළ දේව කැමැත්ත ඉටු කරයි. | **07 පාඩම - ජේසුස් වහන්සේගේ උපත**<br>• ජේසුස් වහන්සේගේ උපත (ලූක් 2 /1 - 7)<br>• එඬේරු හා දේව දූතයෝ ලූක් 2/8 - 20)<br>• ශාස්ත්‍රවන්තයින්ගේ පැමිණීම (මතෙව් 2/1 - 12)<br>• චර්මඡේදනය හා නම් තැබීම (ලූක් 2/21)<br>• ජේසුස් වහන්සේව කැප කිරීම (ලූක් 2/22 - 24) | • ජේසුස් වහන්සේගේ ජීවිතයේ මුල් දින හතළිහේ තොරතුරු විස්තර කරයි.<br>• නිරතුරු දේව ප්‍රශංසාවට යොමු විය යුතු බව පිළිගනියි.<br>• ජේසුස් වහන්සේගේ උපතට අදාළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව කැමැත්තට අනුව කටයුතු කිරීමට පුරුදු වෙයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 02 |
| | 6.2.5 දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් වර්ධනය වෙයි. | **08 පාඩම - ජේසුස් වහන්සේගේ ළමා කාලය**<br>• දේව මාලිගයේ නැතිවීම<br>• ජේසුස් වහන්සේගේ වර්ධනය (ලූක් 2/42 - 51)<br>• ළමා ජේසුස් වහන්සේගෙන් දරුවන්ට ආදර්ශ | • ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.<br>• ජේසුස් වහන්සේ මෙන් ප්‍රසන්න ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනියි.<br>• ජේසුස් වහන්සේ දේව මාළිගාවේ නැතිවීමේ සිද්ධිය රඟ දක්වයි.<br>• ළමා ජේසුස් වහන්සේගේ ජීවිතය ආදර්ශයට ගනිමින් ජීවත් වෙයි.<br>• තම පවුලේ අය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි. | 6.3.1 භක්තියෙන් හා ආශාවෙන් දේව ප්‍රසාද නිධාන ලබයි. | **09 පාඩම - දේව ප්‍රසාද නිධාන**<br>• දේව ප්‍රසාද නිධාන හැඳින්වීම<br>– දේව ප්‍රසාද නිධාන යනු කුමක්ද?<br>– දේව ප්‍රසාද නිධාන හත නම් කිරීම.<br>– දේව වරප්‍රසාද<br>• නොමැකෙන ලාංඡනයක් සනිටුහන් කරන දේව ප්‍රසාද නිධාන<br>• දේව ප්‍රසාද නිධාන වර්ගීකරණය | • දේව ප්‍රසාද නිධාන යන්න නිර්වචනය කරයි.<br>• දේව ප්‍රසාද නිධාන තුළින් දේව වරප්‍රසාද ලබා ගැනීමට උනන්දු වයි.<br>• දේව ප්‍රසාද නිධාන පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව ප්‍රසද නිධාන ලබා ගැනීමට උනන්දුවෙන් කටයුතු කරයි.<br>• දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම සඳහා මිතුරන් උනන්දු කරවයි. | 02 |
| | 6.3.2 ප්‍රසාද ස්නාපනයෙන් ලැබූ නව ජීවිතය වර්ධනය කර ගනියි. | **10 පාඩම - ආරම්භක දේව ප්‍රසාද නිධාන**<br>• ප්‍රසාද ස්නාපනය<br>- ලැබෙන වරප්‍රසාද<br>- සංකේතවල සරල අදහස (ජලය, සුදු වස්ත්‍රය, ශුද්ධවූ තෛලය, පාස්කු ඉටි පහන)<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ<br>- ස්ථාපිත කිරීම<br>- ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්ය<br>• අභිවෘද්ධි අලේපය<br>- පෙන්තකොස්ත සිද්ධිය (ඒ ආකාරයට මෙම දේව ප්‍රසාද නිධානය අද ලැබිය හැකි බව) | • ආරම්භක දේව ප්‍රසාද නිධාන පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේව ප්‍රසාද නිධාන තුළින් ක්‍රිස්තියානි ජීවිතය ශක්තිමත් වන බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්ම -කව ඉදිරිපත් කරයි.<br>• තමා ලැබූ නව ජීවිතය වර්ධනය කර ගනියි.<br>• නිතර නිතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට මිතුරන් ව යොමු කරවයි. | 03 |
| | 6.3.3 දේව ප්‍රසාද නිධාන මගින් ආත්මික හා ශාරීරික සුවය ලබයි. | **11 පාඩම - සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන**<br>• සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය<br>- ස්ථාපිත කිරීම (ජුවාම් 20/22-23)<br>- ලැබෙන වරප්‍රසාද<br>- ලැබිය යුතු අවස්ථා<br>- කරන පිළිවෙල<br>• රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය<br>- ලැබෙන වරප්‍රසාද<br>- දිය යුතු අවස්ථා<br>- ස්ථානය සූදානම් කිරීම | • සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන තුළින් සුවය ලැබෙන බව පිළිගනියි..<br>• රෝගීන්ගේ ආලේපය දානය කිරීමට ස්ථානය සූදානම් කරයි.<br>• අදාළ අවස්ථාවල දී සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන ලබයි.<br>• රෝගීන් පිළිබඳ ව මීසමේ පියතුමා දැනුවත් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3.4 මීසම හා පවුල තුළ තම වගකීම් හා යුතුකම් නිසි ලෙස ඉටු කරයි. | **12 පාඩම - සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන**<br>• පූජකවරය<br>- ස්ථාපිත කිරීම (ලූක් 22/19)<br>- පූජකතුමන්ලාගේ සේවාවන්<br>- සහයෝගය දැක්වීම<br>• ආශිර්වාදකාර බන්ධනය<br>- ස්ථාපිත කිරීම (උත්පත්ති 2/18,2/24) (මාක් 10/6 -9)<br>- පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම් (උපදේශකයා 3/12 -16, 7/27 - 28) (කොලොස්සි 3/20) (එපීස 6/1) | • සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන පිළිබඳ ව විස්තර කරයි.<br>• තම දෙමව්පියන්ට සහයෝගය දැක්වීමට පෙළඹෙයි.<br>• පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම් පිළිබඳ ව ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• මීසමේ සේවාවන්ට දායක වෙයි.<br>• තම මීසමේ පියතුමන්ට හා තම මව්පියන්ට ගෞරව කරයි. | 03 |
| 4.0 දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි. | 6.4.1 දස පණත අනුව තම ජීවිතය හැඩගස්වා ගනියි. | **13 පාඩම - දස පණත**<br>• දස පණත හැඳින්වීම (නික්මයාම 20/ 3 - 17, ද්විතීය නීති සංග්‍රහය 5/6 - 21)<br>• දස පණත ලැබීමේ පසුබිම (නික්මයාම 31/18, 34/28, ද්විතීය නීති සංග්‍රහය 4/13 - 14, 5/22)<br>• දස පණතේ එක් එක් පණත නම් කිරීම<br>• දස පණතේ කොටස් 2 කි. (මහෝපදේශය 296) | • දස පනත ලැබීමේ පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• දස පණතට අනුව ජිවත් විය යුතු බව පිළිගනියි.<br>• දසපණතේ ඉගැන්වීම් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• නීති ගරුක පුද්ගලයෙකු ලෙස ජීවත් වෙයි.<br>• සහෝදර ප්‍රේමයෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 6.4.2 සැබෑවූ එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරයි. | **14 පාඩම - දේව ප්‍රේමය**<br>• පළමු පණත් දෙක<br>• කළ යුතු දේවල් හා නොකළ යුතු දේවල් මහෝපදේශය 303 - 310 | • පළමු පණත් දෙක පරිපූර්ණත්වයට පත් කිරීම සඳහා කළ යුතු ක්‍රියාවන් ගොනු කරයි.<br>• අන්‍යාගමික වන්දනාවන්වලට සහභාගි නොවිය යුතු බව පිළිගනියි.<br>• පළමු පණත් දෙකට අනුව නොකළ යුතු දෑ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරයි.<br>• අන්‍යාගම්වලට ගරු කරයි. | 02 |
| | 6.4.3 ඉරු දිනත්, ණය මංගල්‍ය දිනත් නොවැරදීම දිව්‍ය පූජාවට සහභාගී වෙයි. | **15 පාඩම - ඉරු දින ශුද්ධවත් ලෙස ගත කිරීම**<br>• කළයුතු දේවල් හා නොකළ යුතු දේවල් (නික්මයාම 20/8 - 11)<br>• ණය මංගල්‍යයන් හා අදාළ දිනයන් | • ඉරුදින කළ යුතු දෑ ලැයිස්තු ගත කරයි.<br>• ඉරුදින ශුද්ධවන්ත ලෙස ගත කළ යුතු බව පිළිගනියි.<br>• ඉරුදින නොකළ යුතු දේවල් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ඉරුදිනත්, ණය මංගල්‍ය දිනවලත් භක්තියෙන් දිව්‍ය පූජාවට සහභාගි වෙයි.<br>• මිතුරන් සමග ඉරුදින දිව්‍ය පූජාවට නොවරදවාම සහභාගි වෙයි. | 02 |
| | 6.4.4 අසල්වැසියාට දයාව දක්වයි. | **16 පාඩම - සහෝදර ප්‍රේමය**<br>• ඉතිරි පණත් හත (5,7,8 දේව පණත් පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න).<br>• කළ යුතු දේවල් හා නොකළ යුතු දේවල් | • 5,7 හා 8 පණත් අනුව කළ යුතු හා නොකළ යුතු දෑ ලැයිස්තු ගත කරයි.<br>• සැමවිට ම සත්‍යවාදී විය යුතු බව පිළිගනියි.<br>• ලැයිස්තු ගත කළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙයි.<br>• අන්‍යයන්ට ගරු කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.4.5 තමාට වැරදි කළ අයට සමාව දෙයි. | **17 පාඩම - සතුරාට ප්‍රේම කරයි.**<br>මෝසෙස්ගේ නීතිය (මතෙව් 5/38 - 41)<br>• සතුරාට ප්‍රේම කිරීම (මතෙව් 5/43 - 48)<br>• ජේසුස් වහන්සේ සතුරාට සමාව දීම (කුරුස ගසේ දී) (ලූක් 23/34)<br>• ස්තේපන්තුමා සමාව දීම (ක්‍රියා 7/60)<br>• දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා අලි අග්කාට සමාව දීම. | • සතුරාට සමාව දීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සතුරාට සමාව දිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සතුරාට ප්‍රේම කරයි.<br>• සතුරන් හා මිතුරු වෙයි. | 02 |
| | 6.4.6 ශුද්ධවූ සභාවේ පණත් අනුසාර කරයි. | **18 පාඩම - ශුද්ධවූ සභාවේ ශික්ෂා පද**<br>• ශුද්ධවූ සභාවේ (පණත්) ශික්ෂා පද<br>• එක් එක් ශික්ෂා පදය පිළිබඳ කෙටි හැඳින්වීමක් | • ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද පිළිබඳ තොරතුරු ගෙනු කරයි.<br>• ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද අනුසාර කළ යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද අනුසාර කරයි.<br>• ශුද්ධ වූ සභාවේ නඩත්තුව සඳහා ආධාර කරයි. | 01 |
| 5.0 යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි. | 6.5.1 උනන්දුවෙන් යාච්ඤා කරයි. | **19 පාඩම - යාච්ඤාව**<br>• යාච්ඤාව යනු<br>• මැදියම් රැයේ පැමිණි මිත්‍රයා (ලූක් 11/5 - 8)<br>• අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා (ලූක් 18/1 - 8)<br>• පරිසිවරයා හා අයකැමියා (ලූක් 18/9 - 14) | • නොකඩවා බැගෑපත් ව යාච්ඤා කිරීමේ වැදගත්කම පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.<br>• නොකඩවා යාච්ඤා කිරීමේ වැදගත්කම පිළිගනියි.<br>• ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• යාච්ඤාවේ දී නිවැරදි ඉරියව් පවත්වා ගනියි.<br>• එදිනෙදා ජීවිතයේ දී අන් අය හෙළා නොදකියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5.2 දිනපතා නිරතුරුව යාච්ඤා කරයි | **20 පාඩම - යාච්ඤා කළ යුතු අවස්ථා**<br><br>•ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා<br>- බෞතීස්මය ලැබීමේ දී (ලූක් 3/ 21)<br>- සුවය දානය කිරීමට පෙර (ලූක් 5/16)<br>- අපෝස්තුලුවරු තෝරා ගැනීමට පෙර (ලූක් 6/12)<br>- පේදුරුතුමාගේ මහා ප්‍රකාශනයට පෙර (පිලිප්පි කයිසාරයේදී) (ලූක් 9/18)<br>- අන්‍යරූප විලාශවීමට පෙර (ලූක් 9/28)<br>- ස්වාමිවාක් ආරාධනාව ඉගැන්වීමට පෙර (ලූක් 11/1)<br>- මල් උයනේ දී (ලූක් 22/42 )<br>- කුරුගසේ දී (ලූක් 23/34 හා 46)<br><br>•යාච්ඤා කළයුතු අවස්ථා<br>1 උදෑසන අවදි වූ විට - උදයේ ආරාධනාව<br>2 පාසලට හා ගමනක් යාමට පෙර - රැකවල් දේව දූතයාට යාච්ඤාව<br>3 ආහාර අනුභවයට පෙර - භෝජන ආශිර්වාදය<br>4 ආහාර අනුභවයෙන් පසු - භෝජන ස්තෝත්‍රය<br>5 විශේෂ කාර්යයක් ආරම්භ කිරීමට පෙර - ශුද්ධාත්මයාණන් වහන්සේට යාච්ඤාව<br>6 රාත්‍රියේ නිදා ගැනීමට පෙර - රාත්‍රී ආරාධනාව<br>(මෙම සියලු යාච්ඤා කට පාඩම් කරවිය යුතු ය). | • ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා විස්තර කරයි.<br>• සෑම කාර්යයක් ම සිදු කිරීමට පෙර යාච්ඤා කළ යුතු බව පිළිගනියි.<br>• සභාවේ නිල යාච්ඤා කට පාඩමින් උච්චාරණය කරයි.<br>• සභාවේ නිල යාච්ඤා විශ්වාසයෙන් යුතුව උච්චාරණය කරයි.<br>• අන් මතවලට ඇහුම්කන් දෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5.3 ස්වාමිවාක් ආරාධනාව අර්ථාන්විතව යාච්ඤා කරයි. | **21 - පාඩම - ස්වාමිවාක් ආරාධනාව**<br>• (මතෙව් 6/9 - 13, ලූක් 11/2 - 4)<br>i. ස්වාමිවාක් ආරාධනාවේ කොටස් දෙකකි.<br>ii. ප්‍රශංසාත්මක පැතුම් තුන<br>iii. ශාරීරික හා අධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම් හතර<br>• ස්වාමිවාක් ආරාධනාවේ ව්‍යුහය (ස්වාමිවාක් ආරාධනාව කටපාඩම් කරවන්න.) | • ස්වාමිවාක් ආරාධනාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ස්වාමිවාක් ආරාධනාව භක්තියෙන් උච්චාරණය කිරීමට පෙළඹෙයි.<br>• ස්වාමිවාක් ආරාධනාව භක්තියෙන් උච්චාරණය කරයි.<br>• ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීම් දී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.<br>• අයහපතින් වැළකී සිටීමට කටයුතු කරයි. | 01 |
| | 6.5.4 නමෝ මරිය යැදුම භක්තියෙන් යාච්ඤා කරයි. | **22 පාඩම - නමෝමරිය යාච්ඤාව**<br>• (නමෝ මරිය යාච්ඤාවේ කොටස් 2කි<br>i. මංගලම් කීම (ලූක් 1/26 - 38)<br>ii. ශුද්ධවූ සභාව එක් කළ කොටස<br>• දේව මෑණියන්ගේ දර්ශනය වීම්<br>• කිතුනු ජනවන්දනාව තුළ දේව මෑණියන්ට හිමිවන සුවිශේෂී ස්ථානය<br>• දේව මාතාවන් හඳුන්වන නම්<br>• නමෝ මරිය (යාච්ඤාව කට පාඩම් කරවන්න). | • දේව මාතාවන්ට හඳුන්වන වෙනත් නම් ගොනු කරයි.<br>• දේව මාතාවන්ගේ දර්ශනය වීම් විශ්වාස කරයි.<br>• කිතුනු ජනවන්දනාව තුළ දේව මෑණියන්ට හිමි වන සුවිශේෂී ස්ථානය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේව මාතාවන්ට නිසි ගෞරවය දක්වයි.<br>• දේව මාතාවන් මෙන් අන් අය වෙනුවෙන් මැදිහත් වෙයි. | 02 |
| | 6.5.5 ශුද්ධවූ සභාවේ පොදු යැදුම් යාච්ඤාවේ දී භාවිත කරයි. | **23 පාඩම - පොදු යැදුම්**<br>• අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය (සත්‍යතා 12 කි)<br>• තුන්කාල ආරාධනාව (ජේසුස් වහන්සේගේ මාංශගතවීම /කියන අවස්ථා)<br>• පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව (ජේසුස් වහන්සේගේ උත්ථානය/ කියන අවස්ථා)<br>• ත්‍රිත්ව ස්තෝත්‍රය (හැඳින්වීම)<br>• දයාධික මනස්තාපය (කියන අවස්ථා)<br>• මිඛායෙල් අග්‍රදූතයාට යාච්ඤාව<br>• පාපොච්චාරණ ආරාධනාව (මෙම සියලු යාච්ඤා කට පාඩම් කරවීම) | • පොදු යාච්ඤා පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• පොදු යාච්ඤා මතකයේ රඳවා ගැනීම තම ජීවිතයට ප්‍රයෝජනවත් බව පිළිගනියි.<br>• අදාළ යාච්ඤා කට පාඩමින් හා භක්තියෙන් උච්චාරණය කරයි.<br>• යාච්ඤාව එදිනෙදා ජීවිතයට සම්බන්ධ කර ගනියි.<br>• සාමූහිකව ජ්වලිතව යාච්ඤාව කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5.6 හදවතින් නැගෙන යැදුම් දෙවිදුන්ට ඔප්පු කරයි. | **24 පාඩම - නිර්මාණාත්මක යාච්ඤා**<br>• යාච්ඤා වර්ග<br>- ප්‍රශංසා කිරීම<br>- තුති පිදීම<br>- කමාව අයදීම<br>- ඉල්ලීම්<br>(ළමුන්ට යාච්ඤා නිර්මාණය සඳහා අවස්ථාව ලබා දෙන්න) | • යාච්ඤා පිහිට අවශ්‍ය සැමදෙනා වෙනුවෙන් යාච්ඤා කිරීම කිතුනු වගකීම බව ප්‍රකාශ කරයි.<br>• නිරතුරු දේව ප්‍රශංසාවට යොමු විය යුතු බව පිළිගනියි.<br>• යාච්ඤා වර්ග අනුව නිර්මාණය කළ යාච්ඤා ඉදිරිපත් කරයි.<br>• හදවතින් නැගෙන යැදුම් එදිනෙදා ජීවිතයේ දී භාවිතා කරයි.<br>• තමාට අයහපත කරන්නන් උදසා යාච්ඤා කරයි. | 02 |
| | 6.5.7 ශුද්ධ ලියවිල්ල පදනම් කරගෙන භාවනා කරයි. | **25 පාඩම - භාවනාව**<br>• ශුද්ධ ලියවිල්ල පදනම් කරගත් භාවනාවක් | • ශුද්ධ ලියවිල්ල පදනම් කර ගත් භාවනාවක ව්‍යූහය ප්‍රකාශ කරයි.<br>• භාවනාව සඳහා සිත එකලස් කර ගත යුතු බව පිළිගනියි.<br>• ශුද්ධ ලියවිල්ල පදනම් කරගෙන භාවනා කරයි.<br>• එදිනෙදා ජීවිතය තුළ භාවනා කරයි.<br>• පවුලේ අයව ද භාවනාව සඳහා යොමු කරවයි. | 01 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 01 වන පාඩම

## ශුද්ධ බයිබලය

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී එලදායීව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.1.1 : ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ නිවැරදි ව පෙරළයි'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් දෙකට අයත් පොත් වෙන වෙන ම ගොනු කරයි.
- ශුද්ධ බයිබලය නිවසේ ගෞරවාන්විත ව වැඩම කර තැබිය හැකි ආකාර පිළිබඳ යෝජනා ඉදිරිපත් කරයි.
- ශුද්ධ බයිබලයේ පොත් නිවැරදි ව ක්ෂණික ව පෙරළයි.
- ශුද්ධ බයිබලය ගෞරවයෙන් භාවිත කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය ලබා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1** :

- ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- සිදු කළ මෙහෙය තුළ බයිබලයට ගරු කිරීම සඳහා කළ කාර්යයන් (සුදු රෙද්දක් මත තැබීම, දෙපස ඉටි පහන් දල්වීම, නමස්කාර කිරීම, මල් තැබීම, සිඹීම, ඉහළට එසවීම, ගෞරවයෙන් භාවිත කිරීම)
- දිව්‍ය පූජාව තුළ ශුද්ධ බයිබලයට (දේව වචනයට) ගරු කිරීම සඳහා කරන කාර්යයන් (දුම් ඇල්ලීම, ආරම්භක පෙරහැරේ ගෙනියන ආකාරය, දේව වචනය කියවීමට පෙර නමස්කාර කිරීම, දේව වචනය කියවීමෙන් පසු සිඹීම)
- වෙනත් පොත්පත්වලට නොදෙන ගෞරවයක් ශුද්ධ බයිලයට දීමට හේතුව (එහි දේව වචනය අන්තර් ගත නිසා)
- ශුද්ධ බයිබලයේ දේව වචනය අඩංගු නිසා, එය පරිහරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු
  - අල්ලන ආකාරය
  - තැනින් තැන ගෙන යන ආකාරය
  - තැබිය හැකි හා නොහැකි තැන්
  - ගෞරවය සඳහා කළ හැකි දේවල්
- එක් එක් නිවසේ ශුද්ධ බයිබලය තබා ඇති ස්ථාන පිළිබඳ විමසීම හා එම ස්ථානවල යෝග්‍ය අයෝග්‍යතාව පිළිබඳ ව සාකච්ඡා කිරීම
- ගෞරවාන්විත ව ස්ථානගත කර නොමැති නිවෙස්වල ඒවා ගෞරවාන්විත ව වැඩම කර තිබීම පිළිබඳ යෝජනා ලබා ගැනීම.
- ශුද්ධ බයිබලයක් සෑම නිවසක ම තිබීමේ වැදගත්කම හා ප්‍රයෝජන

පියවර 2 :

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම පෙළ පොත, ඇමුණුම 1 හා ඇමුණුම 4 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

පියවර 3 :

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - ශුද්ධ බයිබලය යනු
    - පූජනීය ග්‍රන්ථයකි (දේව වචනය අඩංගු නිසා)
    - දේව අනාවරණයන් අන්තර්ගත වේ (දෙවියන් වහන්සේ මිනිසාට කතා කිරීම.)
  - ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් 2
    - පුරාණ ගිවිසුමේ පොත් 46
    - නව ගිවිසුමේ පොත් 27
    - ශුද්ධ බයිබලයේ පොත් 73
    - එක් එක් කොටසේ පොත්වල නම්

  (කතෝලික ධර්මය සඳහා විශේෂ පන්ති කාමරයක් පාසල තුළ ඇත්නම්, ශුද්ධ බයිබලය ගෞරවාන්විත ව එහි සෑම දින වැඩම කර තබන්න)

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (සෑම ළමයෙකුට ම ශුද්ධ බයිබලය බැගින්)
- සුදු රෙද්දක්, ඉටි පන්දම් දෙකක්, ඉටි පන්දම් දෙක රැඳවීමට රඳවන දෙකක් හෝ පීරිසි දෙකක්
- පන්තියේ සෑම සිසුවෙකුට ම මල බැගින්
- බ්‍රිසල්බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1, 2, 3 හා 4

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයකු පත් කර ගන්න.
- ඔබ එක් එක්කෙනා අත ඇති ශුද්ධ බයිබලයේ පටුන පෙරලන්න.
- එහි ඇති ප්‍රධාන කොටස් දෙක පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පුරාණ ගිවිසුමේ පොත් ගණන ගනින්න.
- ද්වීතීය සම්මත ග්‍රන්ථවල සඳහන් පොත් ගණන ගනින්න.
- පුරාණ ගිවිසුමේ හා ද්වීතීය සම්මත ග්‍රන්ථ යන කාණ්ඩ දෙකට ම පොදු ග්‍රන්ථ දෙක හඳුනා ගන්න.
- එම කාණ්ඩ දෙකට පොදු පොත් දෙක එක් වරක් පමණක් ලියමින්, පුරාණ ගිවිසුමේ ග්‍රන්ථවල නම්, අංක යොදා අනු පිළිවෙළට ලියන්න.
- නව ගිවිසුමේ පොත්වල නම් අංක යොදමින් අනුපිළිවෙළට ලියන්න.
- කණ්ඩායමේ එක් අයෙක් පොතක් නම් කරන විට, සෙසු අය එය පෙරළන්න. (විවිධ අය අවස්ථාව ගනිමින්, මෙය කීප වරක් කරන්න)
- අනතුරු ව, ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු ශබ්ද නගා කියවන්න.
- ඔබ මෙම ක්‍රියාකාරකම තුළින් ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, "ශුද්ධ බයිබලය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිදු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

## ඇමුණුම 2

- මේසයකට සුදු රෙද්දක් එළා, එය මත ශුද්ධ බයිබලය (යෙසයා 55/10-11) පෙරළා, සිංහාසනාරූඪ කරන්න.
- ශුද්ධ බයිබලය දෙපස ඉටි පන්දම් දෙකක් දල්වන්න.
- මලක් බැගින් අතැති ව සිසුන් පන්තියෙන් පිටත පේළියකට සකසන්න.
- ඇමුණුම 3 හෝ උචිත ගීතිකාවක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- අදාළ ගීතිකාව ගයමින්, ගෞරවයෙන් පෙළට ගොස්, ශුද්ධ බයිබලයට නමස්කාර කර, මල ශුද්ධ බයිබලය ඉදිරියේ තබන ලෙස, සිසුන් දැනුවත් කරන්නී
- ගීතිකාව අවසානේ ගුරුවරයා යෙසයා 55/10-11 පාඨය කියවා, සුළු මොහොතක් නිහඬ ව සිට ශුද්ධ බයිබලය ඉහළට ඔසවා "දේව වාක්‍යය එසේ ය" යනුවෙන් පවසා, එය සිඹ, අදාළ ස්ථානයේ තැන්පත් කරයි.
- "පිතා, පුත්‍රයා .......... දමමින්, මෙහෙය අවසන් කරයි.

**ඇමුණුම 3**

දේව වචනයේ සවිය ඔබ ම වේ
දෙවි සමිඳුනි අපගෙ හදට කතා කළ මැනේ
දේව වචනයේ දිරිය ඔබ ම වේ
දෙවි සමිඳුනි අප දිවියට ඇතුළු වුව මැනේ
දේව වචනයේ බලය ඔබ ම වේ
දෙවි සමිඳුනි අපට සවිය ලබා දුන මැනේ
(කිතුනු ගී 65)

**ඇමුණුම 4**

**ගවේෂණ පත්‍රිකාව**

**ශුද්ධ බයිබලය**

ශුද්ධ බයිබලය වූ කලි ලොව පුරා පැතිර සිටින කිතුනුවන්ගේ සදා ගෞරවයට පාත්‍ර වූ, අති පූජනීය ග්‍රන්ථය වේ. එය කිතුනු අපගේ උතුම් ම පොත ය; පොත් මාතාව ය; පොත් වහන්සේ එබැවින් එයට වඩා උතුම් පොතක්, කිතුනු අපට නොමැත. කිතුනු අපගේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම, එයයි. මෙය, අවුරුදු 1200ක් පමණ කාලයක් තුළ කතෘවරුන් හැට දෙනෙකුගේ පමණ දායකත්වයෙන්, ලියන ලද්දකි. එහෙත් එහි වටිනාකම, එක් කාල පරිච්ඡේදයකට සීමා කළ නොහැකි ය. එහි ගැබ් වී ඇත්තේ, සර්ව කාලීන පණිවිඩයකි.

මෙම අති පූජනීය ග්‍රන්ථය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය;

1. පුරාණ ගිවිසුම
2. නව ගිවිසුම

පුරාණ ගිවිසුමේ ක්‍රිස්තුන් වහන්සේ ඉපදීමට පෙර යුගය පිළිබඳ තොරතුරු අඩංගු වන අතර, නව ගිවිසුමේ සඳහන් වන්නේ, ක්‍රිස්තුන් වහන්සේ හා මුල් ශු. සභාව පිළිබඳ ව ය. මෙම කොටස් දෙක අතර සම්බන්ධයක් ඇත. දෙවියන් වහන්සේ ඓතිහාසික සිදුවීම් හා දිවැසිවරුන් ඇතුළු ශ්‍රේෂ්ඨ පුද්ගලයන් මගින් අනාවරණය වීම පුරාණ ගිවිසුමේ අන්තර්ගත වන අතර, නව ගිවිසුමේ සඳහන් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළින් උන් වහන්සේ අනාවරණය වීම ය. එය උන් වහන්සේගේ අනාවරණයේ පූර්ණත්වයයි (හෙබ්‍රෙව් 1/1-2) උන් වහන්සේ කරණ කොට ගෙන මානව සංහතියට ගැලවීම උදා වූ සේක.

**ගෙදර පරිසරයෙන්** :

1. දිනපතා පවුලේ යාච්ඤාවේ දී ශුද්ධ බයියලය භාවිත කිරීමට යොමු කර වන්න.

## 02 වන පාඩම
## පංච පුස්තකය

**නිපුණතාව 1.0** : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා, එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 6.1.2** : පංච පුස්තකය උනන්දුවෙන් භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පංච පුස්තකය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දැක්විය යුතු බව පිළිගනියි.
- පංච පුස්තකය පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරයි.
- පංච පුස්තකය කියවීමට ආශාවක් ඇති කර ගනියි.
- කණ්ඩායම් තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1** :

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- ශුද්ධ බයිබලයේ පොත් ගණන
- ශුද්ධ බයිබලයේ මුල් පොත් 5හි නම්
- ඒවා හඳුන්වන පොදු නාමය

(මිනිත්තු 15)

**පියවර 2** :

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කර වන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3** :

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මල නිර්මාණය කර ඇති බ්‍රිසල් බෝඩ් එකේ, සිසුන්ගේ නිර්මාණ ක්‍රමවත් ව සිසුන් ලවා ම අලවන්න. (පාඩමෙන් පසු එය පංති කාමරයේ අඛණ්ඩ ව ප්‍රදර්ශනය කරන්න)
- ගුරුවරයා, පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- පංච පුස්තකය සඳහා භාවිත වන වෙනත් නම්
    - ව්‍යවස්ථාවලිය
    - මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව
    - නීතිය
    - මෝසෙස්තුමාගේ නීතිය
    - හෙබ්‍රෙව් බසින් "ටෝරා"
- උත්පත්ති පොතේ අන්තර්ගතය (සැකෙවින්)
    - දෙවියන් වහන්සේ ලෝකය මැවීම
    - ආදම් හා ඒව පාපයට වැටීම
    - කායින් හා ආබෙල්
    - නෝවා
    - ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් හා ජෝසෙප්
- නික්මයාම පොතේ අන්තර්ගතය (සැකෙවින්)
    - පාරාවෝ රජතුමා ඉශ්‍රායෙලුන්ට හිරිහැර කිරීම
    - දෙවියන් වහන්සේ ඔවුන් පාරාවෝ රජතුමාගෙන් ගලවා ගෙන පොරොන්දු දේශයට ගෙන යාම
    - එම ගමන අතරතුර සීනයි කන්දේ දී දස පණත දීම
- දෙවියන් වහන්සේ මිනිසාට දැක් වූ ප්‍රේමය මෙම කතා පුවත්වල අන්තර්ගත බව
- එලෙස ම දෙවියන් වහන්සේ අපට ද ප්‍රේම කරන බව
- අප ද එලෙස ම දෙවියන් වහන්සේට ප්‍රේම කළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (සෑම සිසුවෙකුට ම එක බැගින්)
- බ්‍රිසල් බෝඩ් එකක්, ගම්
- කණ්ඩායමකට එක බැගින් A4 කොල, ප්ලැටිග්නම්
- ඇමුණුම 2හි සඳහන් මල් පෙති හා රවුම
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබා දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න.

- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන, ඔබට ලැබී ඇති A4 කොලයේ තනි පැත්තේ සිටින ලෙස, පැහැදිලි හා ලස්සන අත් අකුරින් රචනාවක් හෝ කවියක් හෝ විරිඳුවක් නිර්මාණය කර ලියන්න.
- ඔබේ නිර්මාණය කණ්ඩායමක් ලෙස ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

- වර්ණ 5කින් යුත් තරමක් විශාල මල් පෙති 5ක් කපා ගන්න.
- එම එක් එක් මල් පෙත්ත මත පංච පුස්තකයේ පොත් 5හි නම් (අනුපිළිවෙළ අනුව අංකනය කර) ලියන්න.
- සුදු පාට කොළයකින් රවුමක් කපා, එය මත "පංච පුස්තකය" යනුවෙන් ලියන්න.
- බ්‍රිසල් බෝඩ් එකක් ද පන්තියට ගෙනියන්න.
- බ්‍රිසල් බෝඩ් එක පන්තියේ සැමට ම ප්‍රදර්ශනය වන තැනක රඳවන්න.
- සිසුන් කිහිප දෙනෙකු කැඳවා, බ්‍රිසල් බෝඩ් එක මැද "රවුම" හා "මල් පෙති 5" මලක් සෑදෙන ලෙස (මල් පෙතිවල අංක සැලකිල්ලට ගනිමින්) අලවන ලෙස උපදෙස් දෙන්න.
- එම සිසුන් මල අලවනතුරු, සෙසු සිසුන්ට පංච පුස්තකයේ පොතක නම් ලියූ තුන්ඩුව බැගින් දී තමාට ලැබී ඇති පොත ශුද්ධ බයිබලයෙන් පෙරළා ගන්නා ලෙස උපදෙස් දෙන්න.

**ඇමුණුම 3**

**ගවේෂණ පත්‍රිකාව**

**පංච පුස්තකය**

ශුද්ධ බයිබලයේ මුල් පොත් පහ වන්නේ, උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කතාව හා ද්වීතීය නීති සංග්‍රහයයි. මේවා **පංච පුස්තකය** යනුවෙන් හැඳින් වේ. පංච පුස්තකය සඳහා තවත් නම් භාවිත වේ. ඒවා නම්;

1. මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව
2. ව්‍යවස්ථාවලිය
3. නීතිය හා
4. මෝසෙස්තුමාගේ නීතිය ය.

හෙබ්‍රෙව් බසින් මෙම පොත් පහ "ටෝරා" යනුවෙන් නම් කෙරේ.

උත්පත්ති පොතේ පහත සඳහන් තොරතුරු අඩංගු වේ:

- දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම
- ආදම් හා ඒව පාපයට වැටීම
- කායින් හා ආබෙල් පිළිබඳ කතා පුවත
- නෝවා සහ ජල ගැල්ම
- බාබෙල් කොත
- ආදිපිතෘ ආබ්‍රහම් තුමා
- ආදිපිතෘ ඊසාක් තුමා
- ආදිපිතෘ ජාකොබ් තුමා
- ජෝසෙප්

නික්මයාම පොතේ පහත සඳහන් තොරතුරු අඩංගු වේ:

- පාරාවෝ රජතුමා ඉශ්‍රායෙලුන්ට හිරිහැර කිරීම
- මෝසෙස් තුමා
- දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව පාරාවෝ රජතුමාගෙන් ගලවා ගෙන පොරොන්දු දේශයට ගෙන යාම
- එම ගමන අතරතුර සීනයි කන්දේ දී දස පණත දීම

**ගෙදර පරිසරයෙන්** :

1. අන් අයට ප්‍රේම කිරීමට යොමු කර වන්න.

## 03 වන පාඩම

## ශුභාරංචි

**නිපුණතාව 1.0** : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 6.1.3** : ශුභාරංචි පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සුබාරංචි හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- අප එක් එක්කෙනා අන් අයට සුබාරංචියක් විය යුතු බව පිළිගනියි.
- සුබාරංචි පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් එළි දක්වයි.
- සුබාරංචි එදිනෙදා ජීවිතය තුළ පරිහරණය කරයි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- සුබාරංචි හතරෙහි නම්
- සුබාරංචි නව ගිවිසුමෙහි ස්ථානගත වීම (ආරම්භයේ)
- සුබාරංචිවල අනුපිළිවෙල (නව ගිවිසුමේ)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.
    - සුබාරංචි හතරේ නම්
    - එක් එක් සුබාරංචි කතුවරයා පිළිබඳ හැඳින්වීමක්
    - සුබාරංචි හතරේ සංකේත
    - අප එක් එක්කෙනා අන් අයට සුබාරංචියක් වීමේ වැදගත්කම

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය,
- බ්‍රිසල්බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

### ඇමුණුම 1
### කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකුට ශබ්ද නගා කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කරගෙන, "සුබාරංචි හතර" පිළිබඳව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරිම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිදු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

### ඇමුණුම 2
### ශුද්ධ බයිබලයෙන් සුබාරංචි ඉක්මනින් පෙරළීම සඳහා තරගය

(පෙර දිනයේ දී සෑම සිසුවකුට ම ශුද්ධ බයිබලයක් රැගෙන එන ලෙස දැනුවත් කරන්න)

- තරග කොන්දේසි
  - ගුරුවරයා නම් කරන සුබාරංචිය පෙරළා අත එසවිය යුතු ය.
  - පෙරළිය යුත්තේ අදාළ සුබාරංචියේ ආරම්භයයි.
  - අත එසැවීමෙන් පසු කිසි ම පිටුවක් පෙරළිය නොහැකි ය.
  - අත එසැවීමෙන් පසු පිටු පෙරළන අයට ලකුණු හිමි නොවේ.
  - පළමුව පෙරළන සිසුවාට ලකුණු 10ක් ද, දෙවනුව පෙරළන සිසුවාට ලකුණු 05ක් ද, තෙවනුව පෙරළන සිසුවාට ලකුණු 03ක් ද, විනාඩි 02කට අඩු කාලයකින් පෙරළන සිසුන්ට ලකුණක් ද පිරිනමන්න. (එක් එක් සිසුවට හිමි ලකුණු අදාළ සිසුවා හා අසල සිසුන් මතක තබා ගැනීම ප්‍රමාණවත් වේ.
  - සෑම ලකුණු පිරිනැමීමකින් පසු ශුද්ධ බයිබලය වැසිය යුතු ය.
  - ගුරුවරයා සුබාරංචි නම් කරන අනු පිළිවෙළ

    1. ශු. ලූක් සුබාරංචිය       3. ශු . ජොහන් සුබාරංචිය
    2. ශු. මතෙව් සුබාරංචිය     4. ශු . මාක් සුබාරංචිය

  - තරගය අවසානේ ලකුණු අනුව 1, 2 හා 3 හඳුනා ගෙන උපස්ථම්භනය කරන්න.

**ඇමුණුම 3**
**ගවේෂණ පත්‍රිකාව**
**සුබාරංචි හතර**

නව ගිවිසුමේ කෘතීන් 27ක් අඩංගු වේ. මේවා අතරින් පළමු හතර වන්නේ:

1. මතෙව් සුබාරංචිය
2. මාක් සුබාරංචිය
3. ලූක් සුබාරංචිය හා
4. ජොහන් සුබාරංචියයි

මේවා සුබාරංචි යනුවෙන් හැඳින්වේ. ඒවා නම් කර ඇත්තේ ඒවා ලියන ලද කතුවරුන්ගේ නමිනි. එම කතුවරුන් හතර දෙනා නම්:

1. ශු. මතෙව් තුමා
2. ශු. මාක් තුමා
3. ශු.  ලූක් තුමා හා
4. ශු. ජොහන් තුමා ය.

ශු. මතෙව් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරු දොළොස් දෙනාගෙන් කෙනෙකි. ජේසුස් වහන්සේ ශු. මතෙව් තුමා කැඳවීමට පෙර ඔහු අයබදු එකතු කරන්නෙකි. එතුමාගේ පියා අල්ෆේවුස් ය. එතුමාගේ සුබාරංචියේ සංකේතය වන්නේ, "මිනිසා" ය.

ශු.මාක් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක් නොවේ. එතුමා සඳහා ජොහන් මාක් යනුවෙන් ද භාවිත වේ. එතුමා ශු. පේදුරු තුමාගේ ගෝලයෙකි. ශු. පේදුරු තුමාගේ භාෂා පරිවර්තකයා ලෙස ද ඔහු කටයුතු කර ඇත. මේ නිසා ජේසුස් වහන්සේ පිළිබඳ බොහෝ තොරතුරු ශු. පේදුරුතුමාගෙන් දැනගන්නට ඇත. මෙතුමාගේ සුබාරංචියේ සංකේතය වන්නේ, "සිංහයා" ය.

ශු. ලූක් තුමා ද ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක් නොවේ. එතුමා ඉතිහාසඥයෙකි; චිත්‍ර ශිල්පියෙකි; වෛද්‍යවරයෙකි. සුබාරංචියක් ලියන ලද එක ම අන්‍ය ජාතිකයා ය. ශු. පාවුලු තුමා සමග ධර්මදූත සේවයේ නියැලී ඇත. විවිධ මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගෙන මෙම සුබාරංචිය සම්පාදනය කර ඇත."ගවයා" මෙම සුබාරංචියේ සංකේතයයි.

ශු. ජොහන් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙකි. මෙතුමාගේ සහෝදරයා ශු. මහා ජාකොබ් තුමා ය. එතුමා ද ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙකි. ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් වීමට පෙර මෙම දෙදෙනා ධීවරයෝ වූහ. සෙබදි හා සලෝමේ මෙම අපෝස්තුලුවරුන් දෙදෙනාගේ දෙමව්පියන් ය. මරිය තුමිය සලෝමේගේ ඥාතිවරියකි. එබැවින් මෙම දෙදෙනා ජේසුස් වහන්සේගේ ඥාති සහෝදරයෝ වූහ. "රාජාලියා" මෙම සුබාරංචියේ සංකේතයයි.

**ගෙදර පරිසරයෙන්** :

1. අන් අයට සහනය දෙන ආකාරයේ ක්‍රියා කිරීමට පොළඹවන්න.

## 4 වන පාඩම

## ලෝකය මැවීමේ පුවත

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි..

**නිපුණතා මට්ටම 6.2.1** : දේව මැවිල්ල අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- මැවීම පිළිබඳ පළමු කතාවේ එක් එක් දිනය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දෙවියන් වහන්සේ ලෝකය මැවූ බව පිළිගනියි.
- එක් එක් දිනයේ දේව මැවිලි නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- දේව මැවිල්ල අගය කරයි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර** 1

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- සියලු මැවිලි ලබා දුන්නේ දෙවියන් වහන්සේ බව
- දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරු බව
- දේව මැවිල්ල අපට ලබා දී ඇත්තේ අපට ඇති ආදරය නිසා බව
- එම නිසා දේව මැවිල්ලට අප ආදරය කළ යුතු බව

(මිනිත්තු 20)

**පියවර** 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 30)

**පියවර** 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- දෙවියන් වහන්සේ දින හයක් තුළ ලෝකය මැවූ බව (උත්පත්ති 1/1-2/4 අ)

| දිනය | මැවිල්ල |
|---|---|
| පළමුවන දිනය | දවාල හා රාත්‍රිය |
| දෙවන දිනය | අහස හා සාගරය |
| තුන්වන දිනය | ගොඩබිම |
| හතරවන දිනය | ඉර හඳ හා තාරකා |
| පස්වන දිනය | පක්ෂීන් හා මසුන් |
| හයවන දිනය | සතුන් හා මිනිසා |

- මේ සියලු මැවිලි දේව නිර්මාණ බව (ගීතාවලිය 104)
- දෙවියන් වහන්සේ මිනිසාට අවශ්‍ය පරිසරය ලබා දුන් බව
- මිනිසාගේ සුබ සිද්ධිය සඳහා සියලු මැවිලි මවා ඇති බව
- දේව මැවිල්ල අගය කළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1/1-2/4අ, ගීතාවලිය 104)
- බ්‍රිසිල් බෝඩ්,
- ජ්ලැටිග්නම්, ඩිමයි කඩදාසි
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න.
- උත්පත්ති 1/1-2/4අ හා ගීතාවලිය 104 හොඳින් කියවන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන, එක් එක් දිනයේ දේව මැවිලි නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න (චිත්‍ර, පෝස්ටර්, කවි, විරිඳු, ගීතිකා, දෙබස්)

**ඇමුණුම 2**

- සිසුන් පරිසරයේ සිත් ගන්නා ස්ථානයකට රැගෙන යන්න.
- සිසුන් දැනුවත් කර අවට පරිසරය හොඳින් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- තමන් පරිසරයේ අත්දුටු දේ සිසුන්ගෙන් අසා, හුණු පුවරුවේ සටහන් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පරිසර හිතකාමී වන්නට ළමුන් යොමු කරන්න.

## 5 වන පාඩම

## විවිධාකාර දේව මැවිල්ල

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.2.2** : දේව මැවිල්ල ආරක්ෂා කරමින්, දෙවියන් වහන්සේට තුති පුදයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- මැවිල්ල ආරක්ෂා කිරීමට කළ යුතු දේවල් ගොනු කරයි.
- දේව මැවිල්ල ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.
- දේව මැවිල්ල ආරක්ෂා කිරීමට මිනිසා අපොහොසත් වී ඇති ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මැවිල්ල ආරක්ෂා කිරීමට ඉදිරිපත් වෙයි.
- පාසල් පරිසරය අලංකාර කිරීමට එකමුතු වී, සහයෝගයෙන් වැඩ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පියවර 1

''පින් සිදු වන්නේ'' ගීය ලියූ පත්‍රිකා සිසුන්ට බෙදා දී, එම ගීය සිසුන් සමඟ තාලයට ගායනා කරන්න. පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් මෙහෙය වන්න.

- කිරිල්ලී ළමා අපෙන් කරන ඉල්ලීම්
- කුරුලු කූඩුව කඩන්න එපා
- දිවි රැක ගැනීමට ඉඩ දෙන්න
- කුරුලු කූඩුවේ රැඳීමට ඉඩ දෙන්න

- දේව මැවිල්ලට අයත් වන දේවල් - (අහස, පොළොව, ඉර, හඳ, තාරකා, ගස්වැල්, පක්ෂීන්, මසුන්, සතුන් හා මිනිසා)
- දේව මැවිල්ල ආරක්ෂා කිරීම අප සතු වගකීමක් බව

(මිනිත්තු 15)

පියවර 2

- සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිතා කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - මැවිල්ල වර්ධනය කිරීමට හා ආරක්ෂා කිරීමට මිනිසාට පැවරූ බව (උත්පත්ති 1/28-29 හා 2/15)
  - දේව මැවිල්ල වර්ධනය කිරීමට අප වෙහෙස විය යුතු බව
  - පරිසරය අලංකාර කිරීමට අප දායක විය යුතු බව
  - අප අවට පරිසරය (නිවාස, පාසල්) පවිත්‍ර ව තබා ගත යුතු බව
  - මිනිසාගේ ප්‍රයෝජනය සඳහා ධාන්‍ය හා පැළෑටි ලැබී ඇති බව
  - මිනිසාගේ පැවැත්ම සඳහා ගස් වැල් දී ඇති බව
  - එම නිසා අප දෙවියන් වහන්සේට තුති පිදිය යුතු බව
  - දෙවියන් වහන්සේ මැවූ ලෝකය ආරක්ෂා කිරීමට මිනිසා අපොහොසත් වී ඇති බව
  - දේව මැවිල්ල ආරක්ෂා කිරීම අප සතු යුතුකමක් බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1/28 හා 2/15)
- ''පින් සිදු වන්නේ'' ගීය ලියූ පත්‍රිකා
- ඩිමයි කඩදාසි, බ්‍රිසිල් බෝඩ්, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, ඔබේ කණ්ඩායමට ලැබී ඇති ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න

**1 කණ්ඩායම**

- උත්පත්ති 1/28-29 හා 2/15 කියවන්න.
- දේව මැවිල්ල වර්ධනය කිරීම සඳහා ඔබට ගත හැකි ක්‍රියා මාර්ග පෝස්ටරයක් මඟින් නිරූපණය කරන්න

**2 කණ්ඩායම**

- උත්පත්ති 1/28-29  කියවන්න.
- දේව මැවිල්ල මගින් මිනිසාට ලැබෙන ප්‍රයෝජන දෙබසක් මගින් ඉදිරිපත් කරන්න.

**3 කණ්ඩායම**

- දේව මැවිල්ල ආරක්ෂා කිරීමට අද මිනිසා අපොහොසත් වී ඇති ආකාරය චිත්‍රයකට නගන්න.

**4 කණ්ඩායම**

- .ඔබ නිවස හා පාසල පවිත්‍රව හා අලංකාරව තබා ගත හැකි ආකාර 10ක් වෙන වෙන ම ලියා දක්වන්න.

| නිවස පවිත්‍රව හා අලංකාරව තබා ගන්නා ආකාර 10ක් | පාසල පවිත්‍රව හා අලංකාරව තබා ගන්නා ආකාර 10ක් |
|---|---|
| | |
| | |
| | |

**ඇමුණුම 2**

පින් සිදු වන්නේ අනේ බාල ළමුන්නේ
මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ

වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා
උදේ පටන් දවස පුරා කුඩු තනාලා
පින් සිදු වන්නේ ..................

දෙමාපියන් සෙනේ වෙතේ තම දරුවන්ටා
ළමා ඔබෙන් අපට නැතේ මිහිපිට ඉන්නා
සමාවෙලා මෙඅප වෙතේ දිවි රැකගන්නා
නමා යදිමි දෙන්න පුතේ මෙතෙන රැදෙන්ටා

කොළේ කොළේ දමා කුඩා නිවස සදන්නේ
මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ
රළේ රළේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ
පින් සිදු වන්නේ ..............

**ගෙදර පරිසරයෙන් :**

ප්‍රයෝජනවත් පැළ ඔබේ ගෙවත්තේ සිටුවීමට දරුවන් යොමු කරවන්න.

## 6 වන පාඩම

## උතුම්ම මැවිල්ල

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම 6.2.3** : එකිනෙකාට ගරු කරමින්, සාමයෙන් හා සහයෝගයෙන් ජීවත් වෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- මිනිසාගේ උතුම්කම විදහා පාන කරුණු ගොනු කරයි.
- පුද්ගල විවිධත්වයට ගරු කළ යුතු බව පිළිගනියි.
- මිනිසාගේ උතුම්කම නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එකිනෙකාට ගරු කරමින් සහයෝගයෙන් හා සමගියෙන් ජීවත් වීමට පියවර ගනියි.
- අන් මතවලට ඇහුම්කන් දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2 ක්‍රියාත්මකකර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- මනුෂ්‍යයා ජීවමාන කෙනෙකු බව
- මනුෂ්‍යයාට දෙවියන් වහන්සේ ආත්මයක් දී ඇති බව
- මිනිසාට නිර්මාණාත්මක ව කටයුතු කළ හැකි බව
- මිනිසාට බුද්ධියක් හා ඥාන ශක්තියක් ඇති බව
- මිනිසා තුළ දේව ගුණාංග ඇති බව

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කර වන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
    - උතුම් ම දේව මැවිල්ල මිනිසා බව

- මිනිසා අන් මැවිලිවලට වඩා උසස් වීමට හේතු
    1. දේව ස්වරූපය හා සමානකම (උත්පත්ති 1/ 26-28)
    2. මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළීම (උත්පත්ති 2/7)
    3. මිනිසා මැවූ දිනය ''ඉතා'' යහපත් (''ඉතා'' මනහර) බව ප්‍රකාශ කිරීම - 6 වන දවස - (උත්පත්ති 1/31) (අන් දිනවල ''මනහර'' බව පමණි.)
    4. මිනිසා සතුන් ව නම් කිරීම (උත්පත්ති 2/20)
- පුද්ගල විවිධත්වය තුළ එකිනෙකාට ගරු කරමින් සාමයෙන් හා සහයෝගයෙන් ජීවත් විය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1/27-28, 1/31, 2/7, 2/20-23)
- රෝබෝ යන්ත්‍රයක පින්තූරයක්, ක්‍රියාකාරී මිනිස් පින්තූර, බ්‍රිසිල් බෝඩ්,
- ජ්ලැටිග්නම්, ඩිමයි කඩදාසි
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- උත්පත්ති 1/27-28, 1/31, 2/7, 2/20 -23 හොඳින් කියවන්න
- ඉහත බයිබල් පාඨවල ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන මිනිසාගේ උතුම්කම පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න (විරිඳුවක්, කවියක්, නාට්‍යයක්, දෙබසක්, ලිපියක්, කථාවක්, පෝස්ටරයක් )

**ඇමුණුම 2**

- රොබෝ යන්ත්‍රයක පින්තූරයක් හා ක්‍රියාකාරී මිනිස් පින්තූර පන්තියට රැගෙන ගොස්, සිසුන්ට ප්‍රදර්ශනය කරන්න..
- රොබෝ යන්ත්‍රයක් හා ක්‍රියාකාරී මිනිසෙකු අතර වෙනස සිසුන්ගෙන් විමසා හුණු පුවරුවේ සටහන් කරන්න.

| මිනිසා | රොබෝ යන්ත්‍රය |
|---|---|
| දේව නිර්මාණයක් | මිනිස් නිර්මාණයක් |
| මිනිසාට බුද්ධියක් ඇත | බුද්ධියක් නැත |
| මිනිසාට හදවතක් ඇත | හදවතක් නැත |
| මිනිසාට හැඟීම් දැනීම් ඇත | හැඟීම් දැනීම් නැත |
| මිනිසාට නිදහසක් ඇත | රොබෝ යන්ත්‍රය මෙහෙයවනු ලැබේ |
| මිනිසාට අමරණීය ආත්මයක් ඇත | රොබෝ යන්ත්‍රය දිරාපත් වෙයි |

- මෙම කරුණු පදනම් කරගෙන මිනිසාගේ උතුම්කම සිසුන්ට පහදා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

එකිනෙකාට ගරු කරමින් සාමයෙන් හා සහයෝගයෙන් ජීවත් වීමට දරුවන් යොමු කරන්න.

## 7 වන පාඩම

## ජේසුස් වහන්සේගේ උපත

**නිපුණතාව** 2.0 : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 6.2.4 : එදිනෙදා ජීවිතය තුළ දේව කැමැත්ත ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ජේසුස් වහන්සේගේ ජීවිතයේ මුල් දින හතළිහේ තොරතුරු විස්තර කරයි.
- නිරතුරු දේව ප්‍රශංසාවට යොමු විය යුතු බව පිළිගනියි.
- ජේසුස් වහන්සේගේ උපතට අදාළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව කැමැත්තට අනුව කටයුතු කිරීමට පුරුදු වෙයි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පියවර 1

- කිතු උපත දක්වෙන පින්තූර සිසුන්ට ප්‍රදර්ශණය කර, ''කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ'' ගීතිකාව සිසුන් සමග නියමිත තාලයට ගායනා කරන්න.

කිතු උපත දක්වෙන පින්තූර හා ගීතිකාවේ දක්වෙන අදහස් ඉස්මතු කරමින්, පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, සාකච්ඡාවක් කරන්න.

- ජේසුස් වහන්සේගේ උපත සිදු වූයේ බෙත්ලෙහෙමේ ගවමඩුවක බව
- මරිය තුමී හා ජුසේ තුමා දේව කැමැත්තට හිස නැමූ බව
- ජේසුස් වහන්සේ බැලීමට ප්‍රථමයෙන් පැමිණියේ එඬේරුන් බව
- ශාස්ත්‍රවන්තයින් ජේසුස් වහන්සේ ළඟ වැටී පඬුරු ඔප්පු කළ බව
- මිනිස් සමාජය පාපයෙන් බේරා ගැනීමට ජේසුස් වහන්සේ මෙලොවට පැමිණි බව
- දිවැසිවරු බෝහෝ කලකට පෙර කියූ දිවැස් වැකි ඉටු වූ බව

(මිනිත්තු 15)

පියවර 2

- සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර තෙවන පියවරේ දි භාවිතා කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිතා කරමින්, පාඩම සාරාංශ කරන්න.

- සංගණනය සඳහා මරිය තුමිය හා ජුසේ තුමා ගලීලයේ නාසරෙත් නුවර සිට බෙත්ලෙහෙමට ගිය බව (ලූක් 2/1-7)
- ජුසේ තුමා දාවිත්ගේ වංශයට හා පෙළපතට අයිති බව
- දේව දූතයෙක් එඬේරුන්ට දර්ශනය වී කිතු උපත දැන් වූ බව (ලූක් 2/8-20)
- දේව දූතයන් ප්‍රශංසා ගීත ගායනා කළ බව
- එඬේරුන් ජේසුස් වහන්සේ බැලිමට පැමිණි බව (මතෙව් 2/1-12)
- ශාස්ත්‍රවන්තයන් ජේසුස් වහන්සේ බැලීමට පැමිණ, පඬුරු පුදා නමස්කාර කළ බව (මතෙව් 2/1-12)
- ජුදා සම්ප්‍රදාය අනුව, අට දවස පිරුණු කල ජේසුස් වහන්සේට චර්මඡේදනය පිළිවෙත සිදු කළ බව හා ''ජේසුස්'' යන නාමය ඔවුන් වහන්සේට තබන ලද බව (ලූක් 2/21)
- මොසෙස්ගේ ව්‍යවස්ථාවට අනුව ජේසුස් වහන්සේ ව කැප කළ බව (ලූක් 2/22-24)
- ජාතික හා ආගමික චාරිත්‍රවලට අප ගරු කළ යුතු බව
- මරිය තුමිය හා ජුසේ තුමා දේව කැමැත්ත ඉටු කළ බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (ලූක් 2/1-24, මතෙව් 2/1-12)
- ''කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ'' ගීතිකාව ලියූ පත්‍රිකා (කිතුනු ගී අංක 431)
- කිතු උපත දැක්වෙන පින්තූර, නත්තල් කාඩ් පත් සැදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- ඩිමයි කඩදාසි
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
- ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, පහත සඳහන් ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | - | ලූක් 2/1-7 බයිබල් පාඨය හොඳින් කියවා, අදාළ සිද්ධිය රඟ දක්වන්න. |
| 2 කණ්ඩායම | - | මතෙව් 2/1-12 බයිබල් පාඨය හොඳින් කියවා, නත්තල් කාඩ් පතක් නිර්මාණය කරන්න. |
| 3 කණ්ඩායම | - | ලූක් 2/8-20 බයිබල් පාඨය කියවා, නිර්මාණාත්මක ගවලෙනක් සාදන්න. |
| 4 කණ්ඩායම | - | ලූක් 2/21-24 බයිබල් පාඨය කියවා, ඒ ඇසුරින් ඔබ ජාතික හා ආගමික චාරිත්‍රවලට ගරුකරන ආකාර 10ක් ලියන්න. |

**ගෙදර පරිසරයෙන්** :

නත්තල සඳහා නිර්මාණාත්මක ගවලෙනක් සෑදීමට දරුවන් යොමු කරවන්න.

## 8 වන පාඩම

## ජේසුස් වහන්සේගේ ළමා කාලය

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.2.5** : දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින්, ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් වර්ධනය වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ මෙන් ප්‍රසන්න ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනියි.
- ජේසුස් වහන්සේ දේව මාළිගාවේ නැතිවීමේ සිද්ධිය රඟ දක්වයි.
- ළමා ජේසුස් වහන්සේගේ ජීවිතය ආදර්ශයට ගනිමින් ජීවත් වෙයි.
- තම පවුලේ අය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2 ප්‍රදර්ශනය කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡා කරන්න.

- මිනිසෙකු කායික ව, මානසික ව, ආධ්‍යාත්මික ව හා සමාජයීය ව වර්ධනය විය යුතු බව
- ඒ සඳහා අන් අයගේ උදව් අවශ්‍ය බව
- ජේසුස් වහන්සේ ද කායික ව, මානසික ව, ආධ්‍යාත්මික ව හා සමාජයීය ව වර්ධනය වූ බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් 2කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කර වන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ජේසුස් වහන්සේ දොළොස් වියේ දී නැතිවීමේ සිද්ධිය (ලූක් 2/41-52)
- ළමා කාලයේ දී ම ජේසුස් වහන්සේ සුබ අස්න දේශනා කළ බව

- ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් වර්ධනය වූ බව
- ජේසුස් වහන්සේ මෙන් අප ද පෞරුෂ වර්ධනය කර ගත යුතු බව
- ළමා ජේසුස් වහන්සේගෙන් අපට ලබා ගත හැකි ආදර්ශයන්

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (ලූක් 2/41-52)
- බ්‍රිසිල් බෝඩ්/ඩිමයි කඩදාසි, ප්ලැටිග්නම්
- මිනිසා වර්ධනය වන ආකාරය පෙන්නුම් කරන පින්තූර
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න
- ඔබ කණ්ඩායමට ලැබී ඇති බයිබල් පාඨ කියවන්න
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

**1 කණ්ඩායම**

- ලූක් 2/41-50 පාඨය හොඳින් කියවන්න.
- ජේසුස් වහන්සේගේ දේව මාළිගාවේ නැතිවීමේ සිද්ධිය නාට්‍යයකින් රඟ දක්වන්න

**2 කණ්ඩායම**

- ලූක් 2/41-52 පාඨය හොඳින් කියවන්න.
- ළමා ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ 5ක් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

**ඇමුණුම 2**




අහඹු ලෙස තෝරා ගත් සිසුන් කිහිප දෙනෙකු කැඳවා ශාරීරික, මානසික, ආධ්‍යාත්මික හා සාමාජයීය වර්ධනය පිළිඹිබු කරන පින්තූර අදාළ ස්ථානවල ඇලවීමට උපදෙස් දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ පොත් කියැවීමට දරුවන් යොමු කරන්න.

## 9 වන පාඩම

## දේව ප්‍රසාද නිධාන

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම 6.3.1** : භක්තියෙන් හා ආශාවෙන් දේව ප්‍රසාද නිධාන ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දේව ප්‍රසාද නිධාන යන්න නිර්වචනය කරයි
- දේව ප්‍රසාද නිධාන තුළින් දේව වරප්‍රසාද ලබා ගැනීමට උනන්දු වෙයි.
- දේව ප්‍රසාද නිධාන පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමට උනන්දුවෙන් කටයුතු කරයි.
- දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම සඳහා මිතුරන් උනන්දු කරවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පියවර 1

- මුද්‍රිත පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.

ඒ ඇසුරෙන් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- දේව ප්‍රසාද නිධාන හත
- දැනට ලබා ඇති දේව ප්‍රසාද නිධාන
- 9 ශ්‍රේණියේ දී ලැබිය යුතු දේව ප්‍රසාද නිධානය

(මිනිත්තු 15)

පියවර 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම මහෝපදේශයක් හා ඇමුණුම 1 බැගින් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ලැබී ඇති ක්‍රියාකාරකමේ අවසාන නිමැවුම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලට සංවර්ධනාත්මක යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සමාලෝචනයේ යෙදෙමින්, හුණු පුවරුවේ පාඩම සාරාංශ කරන්න.

- දේව ප්‍රසාද නිධාන යනු
- දේව ප්‍රසාද නිධාන හත
- දේව ප්‍රසාද නිධාන වර්ගීකරණය
- නොමැකෙන ලාංඡනයක් සනිටුහන් කරන, එක් වරක් පමණක් ලැබිය හැකි දේව ප්‍රසාද නිධාන
- දේව ප්‍රසාද නිධාන ලබාගැනීමට ඇති සුදුසුකම්
- කතෝලිකයෙකු අනිවාර්යයෙන් දේව ප්‍රසාද නිධාන ලබා ගත යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- මහෝපදේශය (126, 136 -137 හා 142 )
- මුද්‍රිත පෝස්ටරයක් (දේව ප්‍රසාද නිධාන වර්ගීකරණය දක්වෙන)
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- මහෝපදේශය 126, 136 - 137 හා 142 කියවන්න.
- ඒවා තුළින් මතුවන කරුණු පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් අය හා සාකච්ඡා කරන්න.
- ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන පහත සඳහන් ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න.

**ඇමුණුම 2**

**කණ්ඩායම් අංක 01** - නොමැකෙන ලාංඡන සනිටුහන් කරන දේව ප්‍රසාද නිධාන පිළිබඳ කරුණු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න

**කණ්ඩායම් අංක 02** - දේව ප්‍රසාද නිධාන වර්ගීකරණය පිළිබඳ බිත්ති පුවත්පතකට නිර්මාණ ඉදිරිපත් කරන්න. (මුද්‍රිත පෝස්ටරය ලබා ගන්න.)

**ගෙදර පරිසරයෙන්** :

නියමිත වයසේ දී නියමිත ප්‍රසද නිධාන ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

# 10 වන පාඩම

## ආරම්භක දේව ප්‍රසාද නිධාන

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 6.3.2 : ප්‍රසාද ස්නාපනයෙන් ලැබූ නව ජීවිතය වර්ධනය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ආරම්භක දේව ප්‍රසාද නිධාන පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව ප්‍රසාද නිධාන තුළින් ක්‍රිස්තියානි ජීවිතය ශක්තිමත් වන බව පිළිගනියි.
- ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- තමා ලැබූ නව ජීවිතය වර්ධනය කර ගනියි.
- නිතර නිතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට මිතුරන් ව යොමු කරවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඇමුණුම 2හි ඇති නාට්‍යය පෙර පුහුණුවක් සහිත ව පන්තියට ඉදිරිපත් කරන්න.

ඒ ඇසුරෙන් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

- පළමුවෙන් ම ලබන දේව ප්‍රසාද නිධානය ප්‍රසාද ස්නාපනය බව
- ආත්මික ජීවිතයේ පෝෂණය සඳහා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන බව
- 6 ශ්‍රේණියේ සිසුන් වශයෙන් මේ වන විට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ඇති බව
- වයස අවුරුදු 14 සම්පූර්ණ වූ විට අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම මහෝපදේශයක් හා ඇමුණුම 1 හා 3 බැගින් ලබා දෙන්න.
- අවශ්‍ය කණ්ඩායමට ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම ලබා දෙන්න
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කර වන්න.

(මිනිත්තු 60)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ලැබී ඇති ක්‍රියාකාරකමේ අවසාන නිමැවුම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා, පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ආරම්භක දේව ප්‍රසාද නිධාන තුන
- ප්‍රසාද ස්නාපනය ලැබීම තුළින් අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලැබීමට මගපෑදෙන බව
- ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද
- ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන සංකේත
- එම සංකේත වල අර්ථයන් සැකෙවින්
- දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීම
- ලන්වියානෝ නුවර ප්‍රාතිහාර්යය
- අභිවෘද්ධි ආලේපය පිළිබඳ ව
- පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය හා අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය අතර ඇති සබඳතාව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ක්‍රියා 2/1-13)
- මහෝපදේශය (146 - 147, 155, 162, 164-165)
- DVD පට
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- මහෝපදේශය 146, 147, 155, 162, 164, 165, ක්‍රියා 2/1-13 හා ඇමුණුම 3 කියවන්න
- ඒවා තුළින් මතුවන කරුණු පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් අය හා සාකච්ඡා කරන්න
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න
  - **කණ්ඩායම් අංක 01**
    - ප්‍රසාද ස්නාපනය තුළින් ලැබෙන වරප්‍රසාද, ප්‍රසාද ස්නාපනය සඳහා යොදා ගන්නා සංකේත හා ඒවායේ අර්ථයන් පිළිබඳ ව කණ්ඩායම තුළ සාකච්ඡා කර, කරුණු ගොනු කර ගන්න.
    - ප්‍රසාද ස්නාපනය තුළින් ලැබෙන වරප්‍රසාද හා සංකේත (ජලය, ශුද්ධ වූ තෛලය, පාස්කු ඉටි පහන හා සුදු ඇඳුම) ඇතුළත් කර පෝස්ටරයක් නිර්මාණයක් කරන්න.
  - **කණ්ඩායම් අංක 02**
    - ඇමුණුම 3 කියවා ලන්වියානෝ නුවර සිදු වූ ප්‍රාතිහාර්යය පිළිබඳ තොරතුරු නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.
  - **කණ්ඩායම් අංක 03**
    - පෙන්තකොස්ත සිද්ධිය පිළිබඳ ව (ක්‍රියා 2/1-13) කණ්ඩායම තුළ සාකච්ඡා කර, වැදගත් කරුණු මතු කර ගන්න.
    - පෙන්තකොස්ත සිද්ධිය විරිඳුවකින් ඉදිරිපත් කරන්න.

## ඇමුණුම 2
## දෙබස

(පියා, මව හා දරුවෙකු ප්‍රසාද ස්නාපන මෙහෙයකට පෙර මෙසේ සාච්කඡා කරති)

පුතා : තාත්තේ, ඇයි අපි මේ උත්සවයට ආවේ?

පියා : ඇයි පුතේ, අද ඔයාගේ නංගි ව ක්‍රිස්තියානි කරනවානේ. ඒකයි අපි ආවේ

පුතා : ඉතින්, තාත්තේ ඒක ඔය තරම්ම වැදගත් ද? අපරාදේ මට අද ගෙදර ඉඳලා සෙල්ලම් කරන්න තිබුනා

අම්මා : අනේ පුතේ, එහෙම කියන්න එපා. අද අපිට වැදගත් දවසක්. ඔයාගේ නංගි දෙවියන් වහන්සේගේ දරුවෙක් වෙනවා. එයා ශුද්ධ වූ සභාවට අයිති වෙනවා. ඉතින්, අපිට සතුටුයි නේද?

පියා : ඔයාවත් පුංචි කාලේ මේ වගේ නෑදැයින් එක්ක පල්ලියට ගෙනැල්ලා ක්‍රිස්තියානි කළා. ඒක නිසයි ඔයාට දිව්‍ය සත්ප්‍රසාදය වහන්සේ ලබන්නට පුළුවන් උනේ.

අම්මා : පුතා, කියන්න ඔයා දැන් දේව ප්‍රසාද නිධාන කීයක් ලබලා තියෙනවා ද?

පුතා : තුනයි

අම්මා : ඒ මොනවද?

පුතා : ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, පාපොච්චාරණය

පියා : පුතා, ඔයා 9 ශ්‍රේණියේ දී ලබන්නට යන්නේ මොකක්ද දන්නවා ද?

පුතා : ඔව් ... ඔව්... අභිවෘද්ධි ආලේපය හරි ද?

පියා : ඔව් පුතේ ඔයා හරි. ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, අභිවෘද්ධි ආලේපය මේවාට තමයි ආරම්භක දේව ප්‍රසාද නිධාන කියන්නේ

අම්මා : හරි ... හරි ... තාත්තයි පුතයි කතාව නවත්තන්න, අන්න ෆාදර් එනවා

## ඇමුණුම 3
## ගවේෂණ පත්‍රිකාව
### ලන්චියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ ප්‍රාතිහාර්යය

ක්‍රි.ව. 800 දී පමණ ඉතාලියේ ලන්චියානෝ නුවර ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමාට කැප කරන ලද කුඩා දෙව්මැදුරේ සේවය කළ එක්තරා තාපස පියතුමෙක් දිව්‍ය පූජාව පවත්වන විට, පූප හා මිදි යුෂ ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරෙන්නේදැයි සැක කළේය. දිනක් එතුමා දිව්‍ය පූජාවේ දිව රහස් කරන මොහොතේ පූපය මස් කැබැල්ලක් බවටත්, මිදි යුෂ ලේ බවටත් පත් වන බව දිටී ය. එම මස් කැබැල්ල හා රුධිරය ලන්චියානෝ නුවර විශේෂ දිව්‍ය සත්ප්‍රසාද කරඬුවක අදටත් තැම්පත් කර ඇත.

1574 දී මෙම මස් කැබැල්ල හා රුධිරය පිළිබඳ ව විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරන ලදී. එම විද්‍යාත්මක පර්යේෂණයේ දී කැටි ගැසී තිබූ විවිධ හැඩයෙන් හා විවිධ ප්‍රමාණයෙන් යුත් අසමාන රුධිර කොටස් 5හි බර කිරන ලදී. එහි දී අනාවරණය වූයේ, සෑම අසමාන කොටසක ම බර සමාන වනවා පමණක් නොව, එක් එක් කොටසෙහි බර සියලු කොටස් එකට ගෙන බර කිරන විට ලැබෙන බරට ද සමාන වන බවයි.

1970 දී මෙම මස් කැබැල්ල පිළිබඳ ව තවත් විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරන ලදී. මෙම පර්යේෂණයේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

- මෙම මස් කැබැල්ල හා රුධිරය සැබැවින් ම මනුෂ්‍යයෙකුගේ වේ.
- එම මස් කැබැල්ල මිනිස් හදවතකින් ගත් එකකි.
- මෙම මස් කැබැල්ලෙත්, රුධිරයෙත් ඇත්තේ එකම රුධිර වර්ගයකි. එනම් AB පොසිටිව් වේ.
- මෙම රුධිරයේ දැන් ශරීරයකින් ලබා ගත් රුධිරයක මෙන් ප්‍රෝටීන් හා ඛනිජ වර්ග ඇත. ශරීරයෙන් ඉවත් කළ රුධිරයේ ප්‍රෝටීන් හා ඛනිජ වර්ග පවතින්නේ විනාඩි 20-30ක් පමණක් වන නමුත් මෙවැනි දෑ මෙම රුධිරයෙන් ඉවත් නොවී දිගින් දිගට ම පැවතෙයි.
- මෙම මස්කැබැල්ලට හා රුධිරයට කිසි ම කල් තබා ගැනීමේ ද්‍රව්‍යයක් යොදා නොමැත.
- පාරිසරික හා භෞතික සාධක වලට මෙම මස් කැබැල්ල හා රුධිරය ශතවර්ෂ 12කට අධික කාලයක් නිරාවරණ වී පැවතුණ ද, මෙම මස් කැබැල්ල හා රුධිරය නරක් වී නොමැත.

1978 වර්ෂයේ දී නාසා ආයතනය ටියුරින් නුවර ශ්‍රී සළුව පිළිබඳ පර්යේෂණයක් සිදු කළේ ය. එහි දී අනාවරණය වූයේ ශ්‍රී සළුවේ තැන්පත් ව ඇති ලේ වර්ගය AB පොසිටිව් බව ය. ටියුරින් නුවර ශ්‍රී සළුවේ රුධිරයේ හා මස් කැබැල්ලේත් එක ම ලේ වර්ගයක් තිබීම වැදගත් අනාවරණයක් විය.

**ගෙදර පරිසරයෙන්** :

හැකි සෑමවිටම දිව්‍ය පූජාවට සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

## 11 වන පාඩම

## සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම 6.3.3** : දේව ප්‍රසාද නිධාන මගින් ආත්මික හා ශාරීරික සුවය ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන තුළින් සුවය ලැබෙන බව පිළිගනියි.
- රෝගීන්ගේ ආලේපය දානය කිරීමට ස්ථානය සූදානම් කරයි.
- අදාළ අවස්ථාවල දී සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන ලබයි.
- රෝගීන් පිළිබඳ ව මීසමේ පියතුමා දැනුවත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඇමුණුම 3 හි ඇති ගීතිකාව ගායනා කරමින් ගීත භාවනාවක් මෙහෙය වන්න.

එම භාවනාව ඇසුරෙන්, පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ, සාකච්ඡාව මෙහෙයවන්න.

- ගීතිකාව තුළින් කියැවෙන දේ
- සුවය ලැබිය හැකි ආකාර
- පාපොච්චාරණය තුළින් පව්වලට සමාව ලැබෙන බව
- පියතුමෙකු වෙත ගොස් වසරකට වරක්වත් පාපොච්චාරණය කළ යුතු බව
- රෝගී වන අවස්ථාවල දෙවියන් වහන්සේට යාච්ඤා කළ යුතු බව
- අන් අයට ද සුවය පතා නිතර නිතර යාච්ඤා කළ යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම මහෝපදේශයක් හා ඇමුණුම 1, 3, හා 4 බැගින් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය විටෙක ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට ලැබී ඇති ක්‍රියාකාරකමේ අවසාන නිමැවුම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
- සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය
- ස්ථාපිත කිරීම
- ලැබෙන වරප්‍රසාද
- ලැබිය යුතු අවස්ථා
- හොඳ පාපොච්චාරණයක් කිරීම සඳහා අවශ්‍ය කරුණු
- රෝගීන්ගේ ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය
- ලැබෙන වරප්‍රසාද
- ලැබිය යුතු අවස්ථා
- ස්ථානය සූදානම් කිරීම
- ආත්මික හා ශාරීරික සුවය ලබා දෙන මෙම දේව ප්‍රසාද නිධාන සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන ලෙස හැඳින්වෙන බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- මහෝපදේශය (231-232, 234-235, 261 )
- කුරුසියක්, සුදු රෙද්දක්, කපු පුලුන්, පහනක්, පීරිසියක්, වතුර බේසමක්, තුවායක්, සබන් පෙට්ටියක්
- ඇමුණුම 1, 2, 3, හා 4

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- මහෝපදේශය 231, 232, 234, 235, 261, ඇමුණුම 3 හා 4 කියවන්න
- ඒවා තුළින් මතුවන කරුණු පිළිබඳව කණ්ඩායමේ අනෙක් අය සමග සාකච්ඡා කර, අවශ්‍ය කරුණු ගොනු කර ගන්න.
- ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන පහත සඳහන් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
    - **කණ්ඩායම් අංක 01** - සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය තුළින් ලැබෙන වරප්‍රසාද, ලැබිය යුතු අවස්ථා හා හොඳ පාපොච්චාරණයක් කිරීම සඳහා අවශ්‍ය කරුණු ඇතුළත් පිටු පෙරලනයක් සකස් කරන්න.
    - **කණ්ඩායම් අංක 02** - රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය තුළින් ලැබෙන වරප්‍රසාද, දිය යුතු අවස්ථා පිළිබඳ කරුණු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න

- **කණ්ඩායම් අංක 03** - රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය ලබා දෙන ස්ථානය සූදානම් කරන ආකාරය ප්‍රදර්ශණය කරන්න

**ඇමුණුම 2**

**සුවය සමිඳුගෙන් ගීතිකාව**

සුවය සමිඳුගෙන් පතමු සුවය සමිඳුගෙන්
සුවය සුවය සුවය පතමු සුවය සමිඳුගෙන්

මිදුම සමිඳුගෙන් පතමු මිදුම සමිඳුගෙන්
මිදුම මිදුම මිදුම පතමු මිදුම සමිඳුගෙන්

**ඇමුණුම 3**

**ගවේෂණ පත්‍රිකාව**

**හොඳ පාපොච්චාරණයක් කිරීම සඳහා අවශ්‍ය කරුණු**

- තමාගේ පව් සිහිකිරීම.
- ඒවාට දුක්මනස්ථාප වීම
- මින්මතු පව් නොකරන්නට ඉටා ගැනීම.
- එක පාපයක්වත් නොසඟවා පව් සියල්ලම පියතුමන්ට පැවසිම.
- පියතුමන් නියම කරන දඬුවම ඉටු කිරීම.
  (මහෝපදේශය 235 ට අනුව)

**ඇමුණුම 4**

**ස්ථානය සූදානම් කරන ආකාරය**

- නිවසේ රෝගියා සිටින කාමරය හෝ උචිත ස්ථානයක් පිරිසිඳු කිරීම.
  (රෝගියාට තනිය ම පියතුමා හා කථා කළ හැකි ස්ථානයක් වීම උචිත ය)
- එම ස්ථානයේ කුඩා මේසයක් තබා සුදු රෙද්දක් එළීම
- මේසය මත කුරුසියක් තබා පහනක් දල්වීම
- කපු පුලුන් දමූ පීරිසියක්, වතුර බේසමක්, තුවායක් හා සබන් පෙට්ටියක් මේසය අසල තැබීම

ගෙදර පරිසරයෙන් :

වරදක් කළ හැම විටම පාපොච්චාරණය කිරීමට යොමු කර වන්න.

## 12 වන පාඩම

## සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වී නව ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම 6.3.4 :** මීසම හා පවුල තුළ තම වගකීම් ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන පිළිබඳ ව විස්තර කරයි.
- තම දෙමව්පියන්ට සහයෝගය දැක්වීමට පෙළඹෙයි.
- පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම් පිළිබඳ ව ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- මීසමේ සේවාවන්ට දායක වෙයි.
- තම මීසමේ පියතුමන්ට හා තම මව්පියන්ට ගෞරව කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ගුණාත්මක යෙදවුම්වල දක්වා ඇති පින්තූර/ඡායාරූප පෙන්වමින්, සිසු අදහස් විමසා, පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
  - පූජකතුමෙකුගේ කාර්යයන් පිළිබඳ ව
  - ඔවුන් මීසම් පවුල ආරක්ෂා කර නඩත්තු කරන බව
  - මවකගේ හා පියෙකුගේ කාර්යයන් පිළිබඳ ව
  - ඔවුන් තම පවුල ආරක්ෂා කර නඩත්තු කරන බව
  - පූජකවරුන්ගේ හා දෙමාපියන්ගේ කාර්යයන් සාර්ථක කර ගැනීමට උදව් විය යුතු බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සෑම සිසුවෙකුට ම ඇමුණුම 1 ලබා දෙන්න.
  (පාඩම ආරම්භ කිරීමට පෙර සතියේ කළ යුතු ය.)
- පාඩම උගන්වන දිනයේ සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය බැගින් තිබිය යුතු ය.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 60)

පියවර 3

- එක් එක් සිසුවා සකස් කළ වාර්තාවට අනුව සකසන ලද කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- එක් එක් වාර්තා පිළිබඳ ව අනෙකුත් කණ්ඩායම්වලට සංවර්ධනාත්මක යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සමාලෝචනයේ යෙදෙමින්, හුණු පුවරුවේ පාඩම සාරාංශ කරන්න.

- පූජකවරය ස්ථාපිත කිරීම
- පූජකවරයෙන් නොමැකෙන ලාංඡනයක් ලැබෙන බව
- පූජකවරය එක වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානයක් බව
- පූජකතුමන්ලාගේ සේවාවන්
- කිතුනු දරුවෙකු වශයෙන් පූජකතුමන්ලාගේ සේවාවට හැකි ආකාරයට දැක්විය යුතු සහයෝගය
- ආශිර්වාදකාර බන්ධනය ස්ථාපිත කිරීම
- පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම්
- පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනය, සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන බව
- මින් එක සේවාවකට සෑම අයෙකු ව ම කැඳවා ඇති බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (ලූක් 22/19, උත්පත්ති 2/12, 2/24, මාක් 10/6-9 උපදේශකයා 3/12-16, 7/27-28, කොලොස්සි 3/20, එපීස 6/1 )
- පූජකතුමෙකු හා මීසම් ජනතාව සිටින පින්තූරයක්/ඡායාරූපයක්, මව්පියන් හා දරුවන් සිටින පින්තූරයක්/ ඡායාරූපයක්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨ හොඳින් කියවන්න
- ඒවා තුළින් මතුවන කරුණු හා අනෙකුත් කරුණු ඇතුළත් කරමින් ස්වයං වාර්තාවක් සකස් කරන්න
  - ලූක් 22/19 - පූජකවරය ස්ථාපිත කළ ආකාරය
  - පූජකතුමන්ලා කරන සේවාවන්
  - පූජකතුමන්ලාට අප සහයෝගය දැක්විය යුත්තේ කෙසේ ද?

- උත්පත්ති 2/12, 2/24, මාක් 10/6-9 - ආශිර්වාදකාර බන්ධනය ස්ථාපිත කළ ආකාරය
- උපදේශකයා 3/12-16, 7/27-28, කොලොස්සි 3/20, එපීස 6/1 ආදියට අනුව පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම්

- ස්වයංව සකස් කළ වාර්තාව නියමිත දින කණ්ඩායම් තුළ සාකච්ඡා කර, කණ්ඩායම් වාර්තාවක් සකස් කර, පන්තියට ඉදිරිපත් කරන්න

**ගෙදර පරිසරයෙන්** :

දෙමාපියන්ට හා මීසමේ පියතුමන්ට කීකරු වීමට දරුවන් ව පුරුදු කරන්න.

## 13 වන පාඩම

### දසපණත

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.4.1** : දස පණත අනුව තම ජීවිතය හැඩගස්වා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දස පණත ලැබීමේ පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.
- දස පණතට අනුව ජීවත් විය යුතු බව පිළිගනියි.
- දස පණතේ ඉගැන්වීම් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- නීති ගරුක පුද්ගලයෙකු ලෙස ජීවත් වෙයි.
- සහෝදර ප්‍රේමයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

සීනයි කන්දේ දී දෙවියන් වහන්සේ මොසෙස්තුමාට දස පණත දුන් ආකාරය දක්වෙන පින්තූරයක් සිසුන්ට ප්‍රදර්ශනය කර, පින්තූරයේ දක්වෙන අදහස් හා පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- ඉශ්‍රායෙල් ජනතාව සදාචාර සම්පන්න නීති ගරුක ජනතාවක් කිරීම සඳහා දෙවියන් වහන්සේ දස පණත දුන් බව
- එක් එක් පණත නම් කිරීම
- දස පණත සර්ව කාලීන නීති පද්ධතියක් බව
- එම පණත් සෑම අයෙකු ම අනුසාර කළ යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- ඩිමයි කොළ, මාකර් පෑන් ආදිය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය ) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- දස පණත හැඳින්වීම නික්මයාම 31/18 ද්විතීය නීති සංග්‍රහය 4/13-14, 5/22 )
    - සීනයි කන්දේ දී මොසෙස්තුමාට දෙවියන් වහන්සේ දස පණත දානය කළ බව - මහෝපදේශය 295
    - දින 40ක් යාච්ඤා කළ පසු
    - එක් එක් පණත් නම් කිරීම -(නික්මයාම 20/3-17, ද්විතීය නීති සංග්‍රහය 5/6-22)
    - දස පණත කොටස් දෙකකට බෙදිය හැකි බව
- ගල් පුවරු දෙකක් මඟින් එය පෙන්නුම් කරන බව
- ගල් පුවරු 1 -පළමු පණත් තුන
- ගල් පුවරු 2 - හතර සිට දහය දක්වා පණත්
- මෙම පණත් වලින් පුද්ගලයා සදාචාර සම්පන්න නීති ගරුක පුද්ගලයෙකු කරන බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය
  (නික්මයාම 20/3-17, 31/18, 34/28, ද්විතීය නීති සංග්‍රහය 4/13-14, 5/6-22 )
- මහෝපදේශය 296
- සීනයි කන්දේදී දෙවියන් වහන්සේ මොසෙස්තුමාට දසපණත දුන් ආකාරය දක්වෙන පින්තූරයක්
- ඩිමයි කඩදාසි, මාකර් පෑන්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- නික්මයාම 20/3-17, 31/18, 34/28, ද්විතීයීය නීති සංග්‍රහය 4/13-14, 5/6-22 යන ශුද්ධ ලියවිල පාඨ හා මහෝපදේශය 296 හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන ඔබේ කණ්ඩායමට පැවරෙන ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

1 කණ්ඩායම - දස පණත පිළිවෙළට ලියා පොස්ටරයක් නිර්මාණය කරන්න.

2 කණ්ඩායම - සීනයි කන්දේ දී දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට දස පණත දුන් ආකාරය නාට්‍යයකින් ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

දිනපතා පවුලේ යැදුමේ දී එක් එක් පණතට අනුව පවුලේ සියලු දෙනා ජීවත් වූවාදයි සාකච්ඡා කරන්න.

# 14 වන පාඩම

## දේව ප්‍රේමය

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.4.2** : සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පළමු පණත් දෙක පරිපූර්ණත්වයට පත් කිරීම සඳහා කළ යුතු ක්‍රියාවන් ගොනු කරයි.
- අන්‍යාගමික වන්දනාවන්වලට සහභාගි නොවිය යුතු බව පිළිගනියි.
- පළමු පණත් දෙකට අනුව නොකළ යුතු දෑ නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරයි.
- අන්‍යාගම්වලට ගරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පියවර 1

ගුණාත්මක යෙදවුමේ සඳහන් පෝස්ටරය සිසුන්ට ප්‍රදර්ශණය කර, ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- මේවා දෙවියන් වහන්සේට ප්‍රසන්න ක්‍රියාවන් නොවන බව
- එම නිසා ඒවායින් ඈත් විය යුතු බව
- පළමු පණත් දෙක නම් කිරීම
- පෝස්ටරයේ සඳහන් ක්‍රියාවන් පළමු පණත් දෙකට විරුද්ධ ක්‍රියාවන් බව

(මිනිත්තු 15)

පියවර 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 2 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කර වන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.

- පළමු පණත අනුව සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව (ද්විතීයිය නීති සංග්‍රහය 5/7-8 හා මහෝපදේශය 303-304)
- පළමු පණත පූර්ණත්වයට පත් කිරීම සඳහා කළ යුතු දෑ
- පළමු පණතට අනුව නොකළ යුතු දෑ
- දෙවියන් වහන්සේට හිමි තැන පුද්ගලයෙකුට හෝ රූපයකට දිය නොහැකි බව (මහෝපදේශය 312)
- මිථ්‍යා ඇදහිලිවලින් වැළකී සිටිය යුතු බව
- අන්ධ විශ්වාස (හූණියම්, අංජනම් බැලීම, නූල් බැඳීම වැනි) (මහෝපදේශය 313)
- දෙවන පණත අනුව දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය ගැන බොරුවටත් නිරන්තරයටත් නොදිව්රව (ද්විතීයිය නීති සංග්‍රහය 5/11)
- සත්‍යය වෙනුවෙන් පමණක් අධිකරණයේ දී දේව නාමයෙන් දිව්රිය හැකි බව
- දෙවන පණතට අනුව නොකළ යුතු දෑ
- දෙවියන්වහන්සේගේ නාමයෙන් දිව්රීම
- ශුද්ධවූ දේවල් වලට අගෞරවය කිරීම
- බාරහාර ඔප්පු නොකිරීම

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (ද්විතීය නීති සංග්‍රහය 5/7-8, 5/11)
- මහෝපදේශය 303-304, 312-314
- පළමු පණත් දෙකට අනුව නොකළයුතු දෑ දැක්වෙන පෝස්ටරයක්
- ඩිමයි කොළ හා ප්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ද්විතීය නීති සංග්‍රහය 5/7-8, 5/11 යන ශුද්ධ ලියවිලි පාඨ හා මහෝපදේශය 303-304, 312-313 හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන ඔබේ කණ්ඩායමට පැවරෙන ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

1 කණ්ඩායම - පළමු පණතට විරුද්ධ ක්‍රියා ලැයිස්තු ගත කර පෝස්ටරයක් නිර්මාණය කරන්න.

2 කණ්ඩායම - ''සැබෑ වූ එක ම දෙවියන්වහන්සේට පමණක් වන්දනා කරමු'' යන මාතෘකාව යටතේ රචනයක් හෝ කවියක් ලියන්න.

3 කණ්ඩායම - පළමු පණතට විරුද්ධව කටයුතු කරන පුද්ගලයෙකුට ඔබ උපදෙස් දෙන ආකාරය නාට්‍යයකින් ඉදිරිපත් කරන්න.

4 කණ්ඩායම - දෙවන පණතට විරුද්ධව කටයුතු කරන පුද්ගලයෙකුට ඔබ උපදෙස් දෙන ආකාරය නාට්‍යයකින් ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

මිථ්‍යා ඇදහිලි ප්‍රතික්ෂේප කරන්න.

## 15 වන පාඩම

## ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම

**නිපුණතාව 01** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.4.3** : ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් නොවැරදීම දිව්‍ය පූජාවට සහභාගි වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ඉරුදින කළ යුතු දෑ ලැයිස්තු ගත කරයි.
- ඉරුදින ශුද්ධවන්ත ලෙස ගත කළ යුතු බව පිළිගනියි.
- ඉරුදින නොකළ යුතු දේවල් නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- ඉරුදිනත් ණය මංගල්‍ය දිනවලත් භක්තියෙන් දිව්‍ය පූජාවට සහභාගි වෙයි.
- මිතුරන් සමග ඉරුදින දිව්‍ය පූජාවට නොවැරදීම සහභාගි වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ගුණාත්මක යෙදවුමේ සඳහන් පින්තූරය සිසුන්ට පෙන්වා, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- ඉරුදින දෙවියන් වහන්සේට හිමි දිනයක් බව
- ඉරුදින ණය මංගල්‍ය දිනයක් බව
- ඉරුදින ශුද්ධවන්ත ලෙස ගත කළ යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.

- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය ඉරුදින සිහිපත් කරන බව
- ඉරුදින අප කළ යුතු දේවල් (මහෝපදේශය 332)

- දිව්‍ය පූජාවට සහභාගි වීම
- දහම් පාසලට සහභාගි වීම
- අසල්වාසීන්ට උදව් කිරීම
- මීසමේ සමිති සමාගම්වලට සහභාගි වීම
- පවුලේ සමගිය ගොඩනැගීමට කටයුතු කිරීම
- පවුලක් ලෙස එකට වාඩි වී ආහාර ගැනීම, සතුටු සාමිචියේ යෙදීම
- ඉරුදින යහපත් දේ කළ යුතු බව

- ඉරුදින අප නොකළ යුතු දෑ
  - අනවශ්‍ය ලෙස මුදල් ඉපැයීමේ කාර්යයන්හි නියැලීම
  - දිව්‍ය පූජාවට සහභාගි නොවී විනෝද ගමන් යාම
  - වැරදි ක්‍රියාවන්වල යෙදීම (මත්පැන් භාවිතය, සූදුව යනාදිය)
  - ඉරුදින දිව්‍ය පූජාවට හා දහම් පාසලට සහභාගි නොවී උපකාරක පන්ති වලට යාම
  - ණය මංගල්‍ය දිනයන් (මහෝපදේශය 375)

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (නික්මයාම 20/8-11)
- මහෝපදේශය (332 හා 375)
- දේව ජනතාව පවුලක් ලෙස දිව්‍ය පූජාවට සහභාගි වන පින්තූරයක්
- ඇමුණුම .1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- නික්මයාම 20/8-11 යන ශුද්ධ ලියවිල පාඨ හා මහෝපදේශය 332,375 යන වගන්ති හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, ඔබේ කණ්ඩායමට පැවරෙන ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

| | | |
|---|---|---|
| 1 කණ්ඩායම | - | ඉරුදින කළ යුතු හා නොකළ යුතු දෑ ලැයිස්තු ගත කරන්න. |
| 2 කණ්ඩායම | - | ඉරුදින කළ යුතු දෑ ඇතුළත් පෝසටරයක් නිර්මාණය කරන්න. |
| 3 කණ්ඩායම | - | ඉරුදින භක්තියෙන් දිව්‍ය පූජාවට සහභාගිවීමට කළ යුතු ක්‍රියාකාරකම් 5ක් ඉදිරිපත් කරන්න. |
| 4 කණ්ඩායම | - | ශ්‍රී ලාංකිකයන්ට නියමිත ණය මංගල්‍යයන් හා අදාළ දිනයන් පෙළගස්වන්න. |
| 5 කණ්ඩායම | - | ඉරුදින දිව්‍ය පූජාවට හා දහම් පාසලට නොගොස් උපකාරක පන්තිවලට සහභාගි වන ඔබගේ මිතුරෙකුට ඔබ දෙන උපදෙස් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න |

**ගෙදර පරිසරයෙන්** : පවුලක් ලෙස සෑම ඉරුදිනක ම හා ණය මංගල්‍ය දිනක ම දිව්‍ය පූජාවට සහභාගි වන්න.

## 16 වන පාඩම

## සහෝදර ප්‍රේමය

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.4.4** : අසල්වැසියට දයාව දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- 5, 7 හා 8 පණත් අනුව කළ යුතු හා නොකළ යුතු දෑ ලැයිස්තුගත කරයි.
- සැමවිට ම සත්‍යවාදී විය යුතු බව පිළිගනියි.
- ලැයිස්තු ගත කළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙයි.
- අන්‍යයන්ට ගරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ගුණාත්මක යෙදවුමේ සඳහන් පෝස්ටරය සිසුන්ට ප්‍රදර්ශනය කර, ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.
- වර්තමාන සමාජය තුළ මෙවැනි දේවල් දිනපතා සිදු වන බව
- ඒවා දේව පණත්වලට විරුද්ධ බව
- 4 සිට 10 දක්වා වූ පණත් නම් කිරීම

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිතා කරන්න.

(මිනිත්තු 55)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- දස පණතේ 4 - 10 දක්වා වූ පණත්වලට අනුව අසල්වැසියන්ට ප්‍රේම කළ හැකි ආකාර හා අසල්වැසි ප්‍රේමයට පටහැනි ක්‍රියාවන් කියැවෙන බව
- මෙම පණත් හත තුළින් අසල්වැසියා සමග ප්‍රේමයෙන් ජීවත් විය යුතු අකාරය ගෙන හැර දක්වන බව
- පස්වන පණතට අනුව
  - කළ යුතු දෑ (මහෝපදේශය 339)
    - ජීවිතය දෙවියන් වහන්සේ විසින් අපට දුන් උතුම් ත්‍යාගයක් බව
    - එය ආරක්ෂා කර, රැක ගැනීම අපගේ යුතුකමක් බව
    - දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිස් ජීවිත සුරැකිය යුතු බව
  - නොකළ යුතු දෑ (මහෝපදේශය 340)
    - මිනීමැරීම, සියදිවි හානිකර ගැනීම හා සණ්ඩු සරුවල් වීම
    - අනවශ්‍ය වචන හුවමාරුවෙන් අසල්වාසීන්ගේ සිත් රිදවීම
    - අන් අය පිළිබඳ අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීම
    - කේලම් කීම, චරිත ඝාතනය
- හත්වන පණතට අනුව
  - කළ යුතු දෑ
    - අන් අයගේ දේපළ ආරක්ෂා කළ යුතු බව
    - ලබා ගත් ණය හා ඉල්ලා ගත් භාණ්ඩ නියමිත කාලයට නැවත ආපසු දිය යුතු බව
    - අහුලා ගත් දේ අයිතිකාරයාට නැවත භාර දීමට උනන්දු විය යුතු බව
  - නොකළ යුතු දෑ (මහෝපදේශය 319)
    - සොරකම් කිරීම හෝ මංකොල්ලකෑම
    - අහුලාගත් දේ අයිතිකාරයාට නැවත භාරනොදී තමන් සතුකර ගැනීම
    - ලබාගත් ණය නැවත නොදීම
    - ශ්‍රමයට සරිලන වැටුපක් නොගෙවීම
    - වංචාව, අල්ලස් ගැනීම
    - ජලය, වැලි, ගල් යනාදිය එකතු කර ප්‍රමිතිය නැති භාණ්ඩ විකිණීම හා භාණ්ඩ සඟවා තබා වැඩි මිලට විකිණීම
- අටවන පණතට අනුව
  - කළ යුතු දෑ (මහෝපදේශය 368)
    - දෙවියන් වහන්සේ මෙන් සත්‍යවාදී විය යුතු බව
    - සත්‍යවාදී පුද්ගලයින් අන් අයගේ විශ්වාසය හා කැමැත්ත ලබා ගන්නා බව
    - සත්‍ය කතා කිරීම ගෞරවයක් බව
    - සත්‍ය කතා කිරීම තුළින් අප හා අන් අය අතර විශ්වාසය ගොඩ නැගෙන බව
- නොකළ යුතු දෑ (මහෝපදේශය 369)
  - බොරු කීම
  - වැරදි තීන්දු ලබා දීම
  - අසත්‍ය චෝදනා කිරීම
  - තම වරද අන් අය මත පැටවීම

(මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම්** :

- මහෝපදේශය 339, 340, 359, 368 හා 369
- 5, 7 හා 8 පණත් කඩකිරීමේ අවස්ථා දැක්වෙන පුවත්පත් සිරස්තල ඇතුළත් පෝස්ටරයක්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- මහෝපදේශය 339, 340, 359, 368 හා 369 යන වගන්ති හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න
- කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන ඔබේ කණ්ඩායමට පැවරෙන ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

1 කණ්ඩායම - 5වන පණතට අනුව කළ යුතු හා නොකළ යුතු දෑ නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

2 කණ්ඩායම - 7වන පණතට අනුව කළ යුතු හා නොකළ යුතු දෑ නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

3 කණ්ඩායම - 8වන පණතට අනුව කළ යුතු හා නොකළ යුතු දෑ නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමකට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්** : යහපත් සමාජයක් බිහිකිරීමට දායක වන්න.

## 17 වන පාඩම

## සතුරාට ප්‍රේම කරයි

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.4.5** : සතුරන්ටත් ප්‍රේම කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සතුරාට සමාව දීම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සතුරාට සමාව දිය යුතු බව පිළිගනියි.
- ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- සතුරාට ප්‍රේම කරයි.
- සතුරන් හා මිතුරු වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඇමුණුම 2 හි ඇති ගීතිකාව ශ්‍රවණය කිරීමට සිසුන්ට අවස්ථා ව ලබා දෙන්න.
- ගුණාත්මක යෙදවුමේ සඳහන් පෝස්ටරය සිසුන්ට ප්‍රදර්ශනය කර, සිසුන් හා එක් ව එය ගායනා කරන්න.

එහි දැක්වෙන අදහස් හා පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- මිතුරාට මෙන් ම සතුරාට ප්‍රේම කළ යුතු බව
- වැරදී ම මනුෂ්‍ය ගතියක් වන අතර සමාවදීම දේව ගතියක් බව
- අපට වරද කරන අයට සමාව දිය යුතු බව
- අප කළ වැරදිවලට අන් අයගෙන් සමාව ලබා ගත යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- මෝසෙස් තුමාගේ නීතිය (මතෙව් 5/38-41 හෝ නික්මයාම 21/24)
- සතුරාට ප්‍රේම කිරීම (මතෙව් 5/43-48)
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සතුරාට සමාව දිම (ලූක් 23/34)
- ස්තේපන්තුමා සමාව දීම (ක්‍රියා 7/60)
- අතිඋතුම් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා අලි අග්කාට සමාව දීම (මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (මතෙව් 5/38-41, මතෙව් 5/43-48, ලූක් 23/24 හා ක්‍රියා 7/60)
- පෙම් කරන්න එකිනෙකාට ගීතිකාව ලියූ පෝස්ටරයක්
- කැසට් පටය හා කැසට් රෙකෝඩරය
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- මතෙව් 5/38-41, මතෙව් 5/43-48, ලූක් 23/24 හා ක්‍රියා 7/60 යන ශුද්ධ ලියවිලි පාඨ හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කරන්න

**ඇමුණුම 2**

**පෙම් කරන්න එකිනෙකාට සුහද සොයුරු ප්‍රේමයෙන්**

**දිවි ගෙවන්න එකුමුතු වී සමිඳුන් තුළ සාමයෙන්**

ඔබට වඩා අනුන් උතුම් කොට නිරතුරු සළකන්න
උඩඟු නොවී අසල්වැසියනට බුහුමන් දක්වන්න
අලස නොවී සිතට දිරිය ගෙන කටයුතු සපුරන්න
සමිඳු කෙරේ බැතිය පෙරටු කොට සේවය සලසන්න

දුක් පීඩා කරන අය කෙරේ සාමය පතුරන්න
ඔබට පවා නපුරක් කරන විට නපුරක් නොකරන්න
සතුටු සිනා රැළි නැගෙනා විට ඔබ ද සිනාසෙන්න
දුකට වැටී අනුන් පෙළෙන විට සැබැවින් දුක්වන්න

සැපතෙහි දී සිතෙන් උදම් නොව සතුටට පත්වන්න
විපතෙහි දී නොපසුබට ව තව ඉවසිලිමත් වන්න
උයද හවා දෙවිඳු යැදුම නම් අතපසු නොකරන්න
අසරණයන් පිහිට පතන විට පිළිසරණය වන්න

සියලු දෙනා සමඟ සමගියේ අමරස විඳගන්න
පහන් සිතින් යහගුණ ඇතියන් ඇසුරට පත්වන්න
හැම විට දී හොඳ හැසිරීමෙන් ආදර්ශය දෙන්න
දැහැමි බවින් ඔබ හැම නපුර ම යටපත් කරලන්න

(කිතුනු ගී අංක 214)

**ගෙදර පරිසරයෙන්** :

පවුලේ එදිරිවාදීන් සමඟ සමග වන්න.

## 18 වන පාඩම

## ශුද්ධ වූ සභාවේ පණත්

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 6.4.6** : ශුද්ධ වූ සභාවේ පණත් අනුසාර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශුද්ධ වූ සභාවේ පණත් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුද්ධ වූ සභාවේ පණත් අනුසාර කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභාවේ පණත් අනුසාර කරයි.
- ශුද්ධ වූ සභාවේ නඩත්තුව සඳහා ආධාර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- පාසලේ නීති රීති පිළිබඳව සිසුන්ගෙන් විමසා, ඒවා හුණු පුවරුවේ සටහන් කරන්න.
- ඒවා පිළිපැදිය යුත්තේ කවුරුන්දැයි විමසන්න.

කතෝලිකයින් අයත් වන සංසය පිළිබඳ ව විමසමින්, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- කතෝලිකයන් ශුද්ධ වූ සභාවට අයිති වන බව
- ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් ලෙස කතෝලිකයන් ශුද්ධවූ සභාවේ පණත් අනුසාර කළ යුතු බව

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිතා කරන්න.

(මිනිත්තු 20)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය ) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.

- ශුද්ධවූ සභාවේ පණත් හය (මහෝපදේශය 373)
- එක් එක් පණත පිළිබඳ ව හැඳින්වීමක් (මහෝපදේශය 379-384)

(මිනිත්තු 10)

**ගුණාත්මක යෙදවුම්** :

- මහෝපදේශය 373, 379-384
- ශුද්ධ වූ සභාවේ පණත් ලියූ පෝස්ටරයක්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- මහෝපදේශය අංක 373, 379 - 384 හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කරගෙන, නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න

**ගෙදර පරිසරයෙන්** :

නියම වූ දිනවල ගොඩමස් කෑමෙන් වලකින්න.

## 19 වන පාඩම

## යාච්ඤාව

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නගා ගනියි.

**නිපුණතා මට්ටම** 6.5.1 : උනන්දුවෙන් යාච්ඤා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- නොකඩවා බැහැපත් ව යාච්ඤා කිරීමේ වැදගත්කම පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- නොකඩවා යාච්ඤා කිරීමේ වැදගත්කම පිළිගනියි
- ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- යාච්ඤාවේ දී නිවැරදි ඉරියව් පවත්වා ගනියි
- එදිනෙදා ජීවිතයේ දී අන් අය හෙළා නොදකියි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර** 1

- ඇමුණුම 2හි ඇති දෙබස පෙර පුහුණුවකින් යුතු ව පන්තියට ඉදිරිපත් කර වන්න.

ඒ ඇසුරෙන් පහත දැක්වෙන කරුණු මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.

- යාච්ඤාවට කිතුනු දිවියේ වැදගත් තැනක් හිමි වන බව
- නොකඩවා යාච්ඤා කළ යුතු බව
- අධෛර්ය නොවී යාච්ඤා කළ යුතු බව
- යාච්ඤාවෙන් යහපත් දේ පමණක් යැදිය යුතු බව

(මිනිත්තු 15)

**පියවර** 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම හා ඇමුණුම 1 ලබා දෙන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

**පියවර** 3

- එක් එක් කණ්ඩායමට ලැබී ඇති උපමාව රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න
- උපමා රඟ දැක්වීමේ දී අත් හැරුණු කරුණු පිළිබඳ ව කණ්ඩායම් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සමාලෝචනයේ යෙදෙමින්, හුණු පුවරුවේ පාඩම සාරාංශ කරන්න.

- යාච්ඤාව යනු
- මැදියම් රැයේ පැමිණි මිත්‍රයා පිළිබඳ උපමාව (ලූක් 11/5-8)

- අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා පිළිබඳ උපමාව (ලූක් 18/1-8)
- දෙවියන් වහන්සේ කාරුණික පියෙක්
- ඔවුන් වහන්සේ අපට අවශ්‍ය දේ දෙන බව
- නොකඩවා යාච්ඤා කිරීමේ වැදගත්කම
- පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව (ලූක් 18/9-14)
- දෙවියන් වහන්සේ අප ව හඳුනන නිසා යාච්ඤාවේ දී තමන් ගැන වර්ණනා කිරීම අනවශ්‍ය බව
- තමන්ගේ දුබලකම් දෙවිඳුන් ඉදිරියේ පිළිගැනීම
- යාච්ඤාවේ දී පවත්වා ගත යුතු ඉරියව්
- දුබලකම් පිළිගැනීමෙන් හා ඉරියව් මගින් නිහතමානීකම ප්‍රදර්ශනය වන බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම - (ලූක් 11/5-8, 18/1-8, 18/9-14)
- ඇමුණුම 1, 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවන්න.
- එම පාඨයෙන් මතුවන කරුණු පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් අය සමග සාකච්ඡා කරන්න.
- අදාළ උපමාව රඟ දැක්වීමට සූදානම් වන්න.
  - 1 කණ්ඩායම - (ලූක් 11/5-8)
  - 2 කණ්ඩායම - (ලූක් 18/1-8)
  - 3 කණ්ඩායම - (ලූක් 18/9-18)

**ඇමුණුම 2**

**නියුක්තිකරණය සඳහා දෙබස**

අක්කා : මල්ලී, යමු ද අපි සෙල්ලම් කරන්න

මල්ලී : මට නම් බැහැ අක්කේ

අක්කා : ඇයි මල්ලී එහෙම කියන්නේ, මොකුත් ප්‍රශ්නයක් ද?

මල්ලී : අනේ මන්ද,.......(සුසුම් හෙළයි) මට විභාගෙට ලකුණු අඩුයි අක්කේ

අක්කා : මල්ලී පාඩම් කළා ද?

මල්ලී : ඔව් අක්කේ මම පාඩම් කළා

අක්කා : පාඩම් කෙරුවාට මදි, පාඩම් කරන්න ඉස්සෙල්ලා යාච්ඤා කළා ද?

මල්ලී : නෑ අක්කේ

අක්කා : මම නම් හැමදාම ඔරසම් කියලා තමයි, පාඩම් කරන්නේ, මට හොඳට මතක හිටිනවා, ලකුණුත් තියෙනවා

**ගෙදර පරිසරයෙන්** :

නිතර නිතර යාච්ඤා කිරීමට යොමු කරන්න

## 20 වන පාඩම

## යාච්ඤා කළ යුතු අවස්ථා

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 6.5.2 : දිනපතා නිරතුරු ව යාච්ඤා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා විස්තර කරයි.
- සෑම කාර්යයක් ම සිදු කිරීමට පෙර යාච්ඤා කළ යුතු බව පිළිගනියි.
- සභාවේ නිල යාච්ඤා කට පාඩමින් උච්චාරණය කරයි.
- සභාවේ නිල යාච්ඤා විශ්වාසයෙන් යුතුව උච්චාරණය කරයි.
- අන් මතවලට ඇහුම්කන් දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

බැතිමත් ව යාච්ඤා කරන දරුවාගේ පින්තූරය ප්‍රදර්ශනය කරමින්, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- යාච්ඤා කරන විට දෙවියන් වහන්සේ වෙත ඒකාත්මික විය යුතු බව
- යාච්ඤාවේ දී කතා කරන්නේ කවුරුන් සමග දැයි කල්පනා කළ යුතු බව
- දේව අභිමතයට අවනත විය යුතු බව
- යාච්ඤා කරන විට කොතෙක් බාධා පැමිණිය ද පසුබට නොවිය යුතු බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර ඇමුණුම 1හි සඳහන් කාර්ය පත්‍රිකා හා ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම බැගින් ලබා දෙන්න.
- සිසුන් ව ගවේෂණයේ යොදවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර තෙවන පියවරේදී භාවිත කරන්න.

(මිනිත්තු 55)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමට පළමු අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ජේසුස් වහන්සේ පහත සඳහන් අවස්ථාවල යාච්ඤා කළ බව
  - බෞතීස්මය ලැබීමේ දී (ලූක් 3/21)
  - සුවය දානය කිරීමට පෙර (ලූක් 5/16)
  - අපෝස්තුලුවරු තෝරා ගැනීමට පෙර (ලූක් 6/12)
  - පේදුරුතුමාගේ මහා ප්‍රකාශයට පෙර (ලූක් 9/18) (පිලිප්පි කයිසාරියේ දී)
  - අන්‍යරූපවිලාශ වීමට පෙර (ලූක් 9/28)
  - ස්වාමිවාක් ආරාධනාව ඉගැන්වීමට පෙර (ලූක් 11/1)
  - කුරුස ගසේ දී (ලූක් 23/34 හා 46)
- දිනපතා නිරතුරු ව යාච්ඤා කළ යුතු බව
- පහත සඳහන් අවස්ථාවල දී පහත සඳහන් යාච්ඤා භාවිත කළ හැකි බව
  - උදෑසන අවදි වූ විට - උදය ආරාධනාව
  - පාසලට හා ගමනක් යාමට පෙර - රැකවල් දේව දූතයාට යාච්ඤාව
  - ආහාර අනුභවයට පෙර - භෝජන ආශිර්වාදය
  - ආහාර අනුභවයෙන් පසු - භෝජන ස්තෝත්‍රය
  - විශේෂ කාර්යයක් ආරම්භ කිරීමට පෙර - ස්ප්‍රීතු සාන්තු වහන්සේට යාච්ඤාව
  - රාත්‍රියේ නිදාගැනීමට පෙර - රාත්‍රී ආරාධනාව
- ඉහත යාච්ඤා කට පාඩම් කළ යුතු බව අවධාරණය කරන්න.
  (වෙනත් දිනක දී ඉහත යාච්ඤා සිසුන්ගෙන් කටපාඩම් ගන්න)
- ශරීරයට ආශ්වාස ප්‍රාශ්වාසය යම් සේ අවශ්‍ය වන්නේ ද ආත්මයට යාච්ඤාව ද එසේ ය.
- ආශ්වාස ප්‍රාශ්වාස කරන්නාක් මෙන් යාච්ඤා කිරීම ද අමතක නොකළ යුතු බව

(මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ලූක් 3/21, 5/6, 6/12, 9/18, 28, 11/1, 23/34 හා 46)
- මගේ පළමු ආගම් පොත, ධර්මෝපදේශසාරය හෝ ළමා යැදුම් පොත (උදය ආරාධනාව, රැකවල් දේව දූතයාට යාච්ඤාව, භෝජන ආශිර්වාදය, භෝජන ස්තෝත්‍රය, ස්ප්‍රීතු සාන්තු වහන්සේට යාච්ඤාව, රාත්‍රී ආරාධනාව)
- බැතිමත් ව යාච්ඤා කරන දරුවෙකුගේ පින්තූරයක්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

**1 කාර්ය පත්‍රිකාව**

- ලූක් 3/21-22 ශුද්ධ ලියවිලි පාඨය කියවා අදහස් බෙදා ගන්න.
- බයිබල් පාඨයෙන් මතු කරන සුවිශේෂි සිද්ධිය කුමක් ද?
- ''ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය; ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි'' යන්නෙහි අවස්ථා සම්බන්ධය කුමක් ද?
- උදෑසන අවදි වූ විට උච්චාරණය කරන ශුද්ධ වූ සභාවේ නිල යාච්ඤාව කුමක් ද?
- එම යාච්ඤාව පන්තිය ඉදිරියේ දී ඔබට ලැබෙන අවස්ථාවේ දී කට පාඩමින් උච්චාරණය කිරීමට සූදානම් වන්න.

**2 කාර්ය පත්‍රිකාව**

- ලූක් 5/12-16 ශුද්ධ ලියවිලි පාඨය කියවා අදහස් බෙදා ගන්න.
- බයිබල් පාඨයෙන් මතු කරන සුවිශේෂි සිද්ධිය කුමක් ද?
- එම සිද්ධියේ අවසානයට ම සිදුවූයේ කුමක් ද?
- පාසලට පැමිණීමට හෝ ගමනක් යාමට පෙර උච්චාරණය කරන ශුද්ධ වූ සභාවේ නිල යාච්ඤාව කුමක් ද?
- එම යාච්ඤාව පන්තිය ඉදිරියේ දී ඔබට ලැබෙන අවස්ථාවේ දී කට පාඩමින් උච්චාරණය කිරීමට සූදානම් වන්න.

**3 කාර්ය පත්‍රිකාව**

- ලූක් 6/12-16 ශුද්ධ ලියවිලි පාඨය කියවා අදහස් බෙදා ගන්න.
- බයිබල් පාඨයෙන් මතු කරන සුවිශේෂි සිද්ධිය කුමක් ද?
- එම සිද්ධියේ මුලින් ම සිදු වූයේ කුමක් ද?
- විශේෂ කාර්යයක් ආරම්භ කිරීමට පෙර උච්චාරණය කරන ශුද්ධ වූ සභාවේ නිල යාච්ඤා කුමක් ද?
- එම යාච්ඤාව පන්තිය ඉදිරියේ දී ඔබට ලැබෙන අවස්ථාවේ දී කට පාඩමින් උච්චාරණය කිරීමට සූදානම් වන්න.

**4 වන කාර්ය පත්‍රිකාව**

- ලූක් 9/18-20 ශුද්ධ ලියවිලි පාඨය කියවා අදහස් බෙදා ගන්න.
- බයිබල් පාඨයෙන් මතු කරන සුවිශේෂි සිද්ධිය කුමක් ද?
- ශ්‍රාවකයින් ජේසුස් වහන්සේ සමග සිටින විට උන්වහන්සේ කුමක් කරමින් සිටි සේක් ද?
- ආහාර අනුභවයට පෙර හා පසු උච්චාරණය කරන ශුද්ධ වූ සභාවේ නිල යාච්ඤා කවරේ ද?
- එම යාච්ඤා දෙක පන්තිය ඉදිරියේ දී ඔබට ලැබෙන අවස්ථාවේ දී කටපාඩමින් උච්චාරණය කිරීමට සූදානම් වන්න.

**5 වන කාර්ය පත්‍රිකාව**

- ලූක් 9/28-36 ශුද්ධ ලියවිලි පාඨය කියවා අදහස් බෙදා ගන්න.
- බයිබල් පාඨයෙන් මතු කරන සුවිශේෂී සිද්ධිය කුමක් ද?
- ජේසුස් වහන්සේ පේදුරු, ජොහාන් හා ජාකොබ් ව කැඳවා ගෙන තාබෝර් කන්දට නැගී කුමක් කළ සේක් ද?
- රාත්‍රී නිදා ගැනීමට පෙර උච්චාරණය කරන ශුද්ධ වූ සභාවේ නිල යාච්ඤා කවරේ ද?
- එම යාච්ඤාව පන්තිය ඉදිරියේ දී ඔබට ලැබෙන අවස්ථාවේ දී කට පාඩමින් උච්චාරණය කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්** :

කෑමට පෙර හා පසු පවුලේ සැම එක් ව භෝජන ආශිර්වාදය හා භෝජන ස්තෝත්‍රය දිනපතා කියන්න

## 21 වන පාඩම
## ස්වාමිවාක් ආරාධනාව

**නිපුණතාව 5.0** : යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නගා ගනියි.
**නිපුණතා මට්ටම 6.5.3** : ස්වාමිවාක් ආරාධනාව අර්ථාන්විතව යාච්ඤා කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :
- ස්වාමිවාක් ආරාධනාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ස්වාමිවාක් ආරාධනාව භක්තියෙන් උච්චාරණය කිරීමට පෙළඹෙයි.
- ස්වාමිවාක් ආරාධනාව භක්තියෙන් උච්චාරණය කරයි.
- ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීමේ දී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.
- අයහපතින් වැලකී සිටීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පියවර 1**
- ''ත්‍රී එක සුර ජේසුනේ'' ගීතිකාව ඇසීමට සැලැස්වීම
- ''ත්‍රී එක සුර ජේසුනේ'' ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න. සිසුන්ව පුහුණු කරන්න.
- එයින් කියැවෙන්නේ කුමක් පිළිබඳවදැයි සාකච්ඡා කරන්න.

පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- ගීතිකාවෙන් කියැවෙන යාච්ඤාව (ස්වාමිවාක් ආරාධනාව)
- එම ගීතිකාව ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාගේ ප්‍රබන්ධයක් බව
- ජේසුස් වහන්සේ ඉගැන්වූ එකම යාච්ඤාව

(මිනිත්තු 20)

**පියවර 2**
- ඇමුණුම 1 ප්‍රදර්ශනය කර, සාකච්ඡාවක් කරන්න.
- ස්වාමිවාක් ආරාධනාව ලියන ලද පෝස්ටරය ප්‍රදර්ශනය කොට, සිසුන් ලවා නිවැරදි ඉරියව් ඇති ව භක්තියෙන් යුතු ව ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීමට සැලැස්වීම.

**පියවර 3**

ගුරුවරයා පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙමින් හුණු පුවරුවේ පාඩම සාරාංශ කරන්න..
- ස්වාමිවාක් ආරාධනාව අඩංගු ශුභාරංචි 2 කි.
- මතෙව් ශුභාරංචියේ 6/9-13
- ලූක් ශුභාරංචියේ 11/2-4
- ස්වාමිවාක් ආරාධනාවේ ව්‍යුහය
- මෙම යාච්ඤාව උච්චාරණයේදී නිවැරදි ඉරියව් භාවිතා කළ යුතුය.
  (දෑත් එසවීම, දෑත් දිගු කිරීම)

- **ස්වාමිවාක් ආරාධනාවේ කොටස් 2ක් ඇත.**
  - **ප්‍රශංසාත්මක පැතුම් 3 කි.**
    - ඔබගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා!
    - ඔබගේ රාජ්‍යය පැමිණේවා!
    - ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවේද ඉටුවේවා!
  - **ශාරීරික හා ආධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම් 4කි.**
    - අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව.
    - අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන්, අපගේ වැරදි ද කමා කළ මැනව.
    - පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී
    - අයහපතින් අප මුදා ගත මැනව.
- ස්වාමිවාක් ආරාධනාව කට පාඩම් කොට භක්තියෙන් යුතුව උච්චාරණය කළ යුතු බව (වෙනත් දිනක දී සිසුන් ගෙන් ස්වාමිවාක් ආරාධනාව කටපාඩමින් ගන්න.)

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** :
- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (මතෙව් 6/9-13, ලූක් 11/2-4)
- ''ත්‍රී ඒකසුර ජේසුනේ ගීතිකාව ලියන ලද පෝස්ටරය
- ''ත්‍රී එක සුර ජේසුනේ'' ගීතිකාව අඩංගු කැසට් පටය / කිතුනු ගී පොත
- කැසට් රෙකෝඩර් යන්ත්‍රයක්
- ඇමුණුම 1 හා 2 හි දක්වන ලද පෝස්ටර

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

**පෝස්ටරය**

විශිෂ්ට නිර්මාණයක්

| | |
|---|---|
| පදමාලාවඃ | : නාසරතයේ ජේසුස් වහන්සේගේ ය. |
| චින්තනය | : නාසරතයේ ජේසුස් වහන්සේගේ ය. |
| සංකල්පය | : නාසරතයේ ජේසුස් වහන්සේගේ ය. |
| ප්‍රකාශනය | : ක්‍රිස්තු ශ්‍රාවකයන්ගේ ය. |
| දිනපතා යැදුම | : අපගේ ය. |

## ඇමුණුම 2
## පෝස්ටරය

විස්තාරණයේ ස්වාමිවාක් ආරාධනාව දක්වා ඇති ආකාරයට පෝස්ටරයක් නිර්මාණය කරගන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිතර නිතර ස්වාමිවාක් ආරාධනාව කටපාඩමින්, නිවැරදි ව, භක්තියෙන් උච්චාරණය කරවන්න.

## 22 වන පාඩම

## නමෝමරිය යාච්ඤාව

**නිපුණතාව** 5.0 : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නගා ගනියි.

**නිපුණතා මට්ටම 6.5.4** : නමෝ මරිය යැදුම භක්තියෙන් උච්චාරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දේව මාතාවන්ව හඳුන්වන වෙනත් නම් ගොනු කරයි.
- දේව මාතාවන්ගේ දර්ශනය වීම් විශ්වාස කරයි.
- කිතුනු ජනවන්දනාව තුළ දේව මෑණියන්ට හිමි වන සුවිශේෂී ස්ථානය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව මාතාවන්ට නිසි ගෞරවය දක්වයි.
- දේව මාතාවන් මෙන් අන් අය වෙනුවෙන් මැදිහත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට මංගලම් කියන අවස්ථාව දක්වෙන පෝස්ටරය ප්‍රදර්ශනය කර, නමෝ මරිය ගීතිකාව ගායනා කිරීම / ඇසීමට සැලැස්වීම.

පින්තූරය හා ගීතිකාව භාවිත කරමින් පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡා කරන්න.

- පින්තූරයේ සිටින දෙදෙනා
- ඔවුන් කරන දෑ
- ඔවුන් කී දෑ

(මිනිත්තු 16)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම ඇමුණුම 1 හා 2 බැගින් සපයන්න.
- සිසුන්ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිතා කරන්න

(මිනිත්තු 34)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමුව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- නමෝ මරිය යාච්ඤාවේ කොටස් 2කි.
- මංගලම් කීම - (ලූක් 1/26-38)
- ශුද්ධවූ සභාව විසින් එක් කළ කොටස
- දේව මෑණියන්ගේ දර්ශනය වීම්
- කතෝලික ජනවන්දනාව තුළ දේව මෑණියන්ට හිමිවන සුවිශේෂී ස්ථානය
- දේව මාතාවන් හඳුන්වන නම්

(මිනිත්තු30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ලූක් 1/26-38)
- කිතුනු ගී පොත හෝ නමෝ මරිය ගීතිකාව අඩංගු කැසට් පටය
- කැසට් රෙකෝඩරය
- ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියට මංගලම් කියන අවස්ථාව දැක්වෙන පෝස්ටරයක්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න
- ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාවේ සඳහන් ශුද්ධ ලියවිලි පාඨය හා අනෙකුත් කරුණු හොඳින් කියවන්න
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන ''දේව මාතාවන් වහන්සේ'' පිළිබඳ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

## ඇමුණුම 2
## ගවේෂණ පත්‍රිකාව

- ශුද්ධ වූ ලූක් 1/26-38
- මිනිස් බව ගත් තම පුත්‍රයාණන් වූ අප ගැලවුම්කරුවාණන් වූ ජේසුස් වහන්සේගේ මව වීමට දෙවියන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද්දේ නිර්මල කන්‍යා මරිය තුමිය වයි.
- ''මේ මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස ම මට ඉටු වේවා!යි '' කියමින්, එතුමිය එම පණිවුඩය කැමැත්තෙන් භාර ගෙන, ජේසුස් වහන්සේ ගේ උපතේ සිට කුරුස ගස දක්වා වූ ගමනේ දී උන්වහන්සේ අනුගාමී වෙමින් ගැලවීමේ කාර්යයට දායක වූවා ය.
- දෙව් මවුන් ජපමාලය අතැති ව කීප වරක් දර්ශනය වී ඇති අතර එතුමිය විසින් ම අවස්ථා 3ක දී ජපමාලය උච්චාරණය කරන ලෙස ප්‍රකාශ කර ඇත.
    - 13වන ශත වර්ෂයේ දී ස්පාඤ්ඤ ජාතික දොමිනික් ගුස්මන් නමැති තරුණ පූජාප්‍රසාදිතුමාට මරිය තුමිය දර්ශනය වී ජපමාල භක්තිය කියා දීම.
    - ක්‍රි.ව. 1858 දී ප්‍රංශයේ ලූර්දු නුවර බර්ණදෙත් නම් ළදරියට දර්ශනය වී ජපමාල භක්තියේ උතුම් බව පෙන්වා දීම.
    - ක්‍රි.ව. 1917 දී පෘතුගාලයේ පාතිමා නුවර ලූසී, ෆ්‍රැන්සිස්කෝ සහ ජසින්තා යන ළමයි තිදෙනාට දර්ශනය වී ජපමාලය කීමට උපදෙස් දීම.
- මෙම දර්ශන තුළින් මරිය තුමිය නිරතුරුව ජපමාලය උච්චාරණය කිරීමටත්, පව්කාරයින්ගේ සිත්හැරීම සඳහා මර්දන ක්‍රියා කිරීමටත්, ලෝකවාසීන්ට ආරාධනා කරයි.
- ජේසුස් වහන්සේගේ මව වීමේ භාග්‍ය හේතු කොට ගෙන මිනිස් ලොව කිසිවෙකු නොලද වරමක් මරිය තුමියට හිමි විය. මේ නිසා දේවත්වයත්, මනුෂ්‍යත්වයත් තමන් තුළ ඒකාබද්ධ කළ කිතු සමිඳුන්ගෙන් පසු ව උසස් ම ගෞරවය හිමි වනුයේ මරිය තුමියට ය.
- දේව මාතාවන් හැඳින් වීමට නම් රාශියක් භාවිතා කරයි. එයින් කිහිපයක් නම්,
    - ලූර්දුවේ දේව මාතාවන්
    - පාතිමාවේ දේව මාතාවන්
    - වේලක්කන්නි මෑණියෝ
    - ලංකා අප ස්වාමිදුව
    - මරද මඩු මාතාව
    - මාතර අප ස්වාමිදුව
    - රෝස කුසුම් මාතාව
    - ජපමාල දේව මාතාව
    - ගර්භවාස දේව මාතාව
    - සදාසරණ මාතාව
    - සින්දාත්‍රි මෑණියෝ
    - කානික්ක දේව මාතාව

ලංකාවේ කතෝලික දේවස්ථානවලින් විශාල ප්‍රමාණයක් කැප කර ඇත්තේ, දේව මාතාවන් වහන්සේට ය.

**ගෙදර පරිසරයෙන්** :

දිනපතා පවුලේ සැම හා එක් ව ජපමාලය කියන්න

## 23 වන පාඩම

## පොදු යැදුම්

**නිපුණතාව 5.0** : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩ නගා ගනියි.

**නිපුණතා මට්ටම 6.5.5** : ශුද්ධ වූ සභාවේ පොදු යැදුම් යාච්ඤාවේ දී භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පොදු යාච්ඤා පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- පොදු යාච්ඤා මතකයේ රඳවා ගැනීම තම ජීවිතයට ප්‍රයෝජනවත් බව පිළිගනියි.
- අදාළ යාච්ඤා කට පාඩමින් හා භක්තියෙන් උච්චාරණය කරයි.
- යාච්ඤාව එදිනෙදා ජීවිතයට සම්බන්ධ කර ගනියි.
- සාමූහිකව ජ්වලිතව යාච්ඤා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

පොදු යාච්ඤා පිළිබඳ ව විමසමින්, හුණු පුවරුවේ ඒවා සටහන් කර, පහත කරුණු අවධාරණය කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

- පොදුවේ යාච්ඤා කිරීමේ දී ශබ්ද නගා උච්චාරණය කළ යුතු බව
- පොදු යාච්ඤා මතකයේ තබා ගැනීමෙන් අවශ්‍ය ඕනෑම විටෙක දී සාංඝික ව යාච්ඤා කළ හැකි බව
- දණ නැමීමෙන් හා දණ ගැසීමෙන් අපගේ ගෞරවය හා අවනතභාවය ප්‍රකාශ වන බව
- නැගිට සිටීමෙන් අපගේ ප්‍රීතිය හා දේව කැමැත්ත ඉටු කිරීමට ඇති අශාව ප්‍රකාශ කරන බව
- දෑත් වැඳ ගැනීමෙන් අපගේ අවධානය හා ශ්‍රද්ධාව ප්‍රකාශ වන බව
- ළයට ගසා ගැනීමෙන් අපගේ සදොස් බව පිළිගන්නා බව

(මිනිත්තු 25)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න

(මිනිත්තු 28)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය තුළ සත්‍යතා 12ක් අඩංගු බව
- ජේසුස් වහන්සේගේ මාංශගතවීම තුන්කාල ආරාධනාව තුළ අඩංගු බව
- දිනපතා උදේ 5.30, මධ්‍යහ්න 12 සහ සවස 6.30 යන වේලාවන්වල දී තුන්කාල ආරාධනාව උච්චාරණය කරන බව
- පාස්කු කාලයේ තුන්කාල ආරාධනාවෙන් ජේසුස් වහන්සේගේ උත්ථානය කියැවෙන බව
- එම යාච්ඤාව කියන අවස්ථා
- දයාධික මනස්ථාපය කියන අවස්ථා
- මේ සෑම යාච්ඤාවක් ම මතකයේ රඳවා ගැනීම දිනපතා යාච්ඤාවල දී ඉතා ප්‍රයෝජනවත් වන බව

(මිනිත්තු 27)

**ගුණාත්මක යෙදවුම් :**

- ''සුහද යැදුම'' යාච්ඤා පොත
- ඩිමයි කඩදාසි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
- ''සුහද යැදුම්'' පොත පෙරළා පහත සඳහන් යාච්ඤා කියවන්න.
  - අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය
  - තුන්කාල ආරාධනාව
  - පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව
  - ත්‍රිත්ව ස්තෝත්‍රය
  - දයාධික මනස්ථාපය
  - මිඛායෙල් අග්‍රදූතයාට යාච්ඤාව
  - පාපොච්චාරණ ආරාධනාව
- ඔබට ලැබී ඇති ඩිමයි කඩදාසි හා ජ්ලැටිග්නම් ඇසුරු කරගෙන තනි පැත්තේ සිටින ලෙස පැහැදිලි හා ලස්සන අත් අකුරින් ඉහත යාච්ඤාවන් ලියන්න.
- ගුරු උපදෙස් අනුව ඔබට ලැබෙන යාච්ඤාව කණ්ඩායමක් ලෙස එකතුවී උච්චාරණය කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන් :**

පොදු යාච්ඤා කටපාඩම් කරවන්න

## 24 වන පාඩම

## නිර්මාණාත්මක යාච්ඤා

**නිපුණතාව 50** : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩ නගා ගනියි.

**නිපුණතා මට්ටම 6.5.6** : හදවතින් නැගෙන යැදුම් දෙවිඳුන්ට ඔප්පු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- යාච්ඤා පිහිට අවශ්‍ය සැම දෙනා වෙනුවෙන් යාච්ඤා කිරීම කිතුනු වගකීම බව ප්‍රකාශ කරයි.
- නිරතුරු දේව ප්‍රශංසාවට යොමු විය යුතු බව පිළිගනියි.
- යාච්ඤා වර්ග අනුව නිර්මාණය කළ යාච්ඤා ඉදිරිපත් කරයි.
- හදවතින් නැගෙන යැදුම් එදිනෙදා ජීවිතයේ දී භාවිතා කරයි.
- තමාට අයහපත කරන්නන් උදෙසා යාච්ඤා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඇමුණුම 2 හි සඳහන් සිදුවීම පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න. ඒ ඇසුරින් පහත දක්වා ඇති කරුණු මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
- ඉහත කතාවට අනුව අපගේ යාච්ඤාව කෙසේ විය යුතුදැයි සාකච්ඡා කරන්න
- පිහිට අවශ්‍ය සැම දෙනා වෙනුවෙන් යාච්ඤා කළ යුතු බව
- කිසිඳු හතුරු-මිතුරු භේදයකින් තොර ව යාච්ඤා කළ යුතු බව
- අපගේ සතුරාට ප්‍රේම කළ යුතු බව

(මිනිත්තු 20)

**පියවර 2**

- එක් එක් සිසුවාට ඇමුණුම 1 හා එහි සඳහන් මංජුසාවෙන් කුසපතක් බැගින් ලබා දෙන්න.
- ඒ ඒ මාතෘකාව යටතේ සිසුන්ට යාච්ඤා නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය වූ විට ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- සිසු ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න

(මිනිත්තු 30)

**පියවර 3**

- යාච්ඤා වර්ග සියල්ල ම ඇතුළත් වන සේ අහඹු ලෙස සිසුන් තෝරා ඒ ඒ ශිෂ්‍යයාට තමන් විසින් නිර්මාණය කළ යාච්ඤාව පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඒ යාච්ඤාවල පවතින අඩුපාඩු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයේ යෙදෙමින් හුණු පුවරුවේ පාඩම සාරාංශ කරන්න.

- ප්‍රශංසා කිරීම, තුති පිදීම, කමාව අයැදීම හා ඉල්ලීම් ලෙස යාච්ඤා වර්ග කළ හැකි බව.
- ශුද්ධ බයිබලයේ ගීතාවලිය අපගේ යාච්ඤා පොත කර ගත යුතු බව
- ඒ ඒ යාච්ඤා වර්ගවලට අදාළ යාච්ඤා ගීතාවලිය තුළ දක්නට ලැබෙන බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය (ගීතාවලිය)
- ඇමුණුම 1, 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- පන්තියේ සිටින සිසුන් ගණන අනුව තුණ්ඩු කැබලි කීපයක යාච්ඤා වර්ගවල මාතෘකා ලියන්න. (ප්‍රශංසා කිරීම, තුති පිදීම, කමාව අයැදීම හා ඉල්ලීම්)
- තුණ්ඩු කැබලි රෝල් කර, මිශ්‍ර කර, මංජුසාවක බහාලන්න.
- මංජුසාවේ ඇති මිශ්‍ර කරන ලද තුණුඩු කැබලි අතුරින් සිසුන්ට එක් තුණ්ඩුව බැගින් තෝරා ගෙන යාච්ඤා නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න

**ඇමුණුම 2**
**හදවතින් නැගෙන යැදුම්**

එක් සෙනසුරාදාවක සවස මීසමේ පියතුමා පල්ලියේ ඉස්තෝප්පුවේ සක්මන් කරමින් කල්පනා කළේ පසු දින ඉරිදා දිව්‍ය පූජාවේ දේශනය සඳහා විශ්වාසකයින්ට මග පෙන්වීමට සුදුසු කරුණු ගැන ය.

මෙසේ සක්මන් කරමින් සිටින අතර එතුමා දේවස්ථානයේ ක්‍රිස්තු ප්‍රතිමාවක පාදයේ සුදු රෙදි කඩකින් ගැටගසා තිබුණු බාරයක් දුටුවේ ය. එතුමා එය ලිහා බැලුවේ ය. සුදු කඩදාසි කැබැල්ලක ඔතන ලද රුපියල් දෙකක් එහි විය. සුදු කඩදාසියේ ඉල්ලීම් කීපයක් ලියා තිබුණි.

''අපට හතුරුකම් කරන ............... තවදුරටත් යහතින් ජීවත් වීමට ඉඩදෙන්න එපා. ලෙඩ ඇඳේ සිටින එයාගේ පවුලට තවත් නැගිටින්න ඉඩ තියන්න එපා. මේ දේවල් ඔබ වහන්සේ ගේ නාමයෙන් ඉෂ්ට වේවා!'' ආමෙන්.

මේ දේවල් ඉටු කරදීම සඳහා ගාස්තුව රුපියල් දෙකයි.

**ගෙදර පරිසරයෙන් :**

ඔබේ සහෝදරයා වෙනුවෙන් යාච්ඤා කරන්න.

## 25 වන පාඩම

## භාවනාව

**නිපුණතාව** 50 : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 6.5.7** : ශුද්ධ ලියවිල්ල පදනම් කර ගෙන භාවනා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශුද්ධ ලියවිල්ල පදනම් කර ගත් භාවනාවක ව්‍යුහය ප්‍රකාශ කරයි.
- භාවනාව සඳහා සිත එකලස් කර ගත යුතු බව පිළිගනියි.
- ශුද්ධ ලියවිල්ල පදනම් කර ගෙන භාවනා කරයි.
- එදිනෙදා ජීවිතය තුළ භාවනා කරයි.
- පවුලේ අය ව ද භාවනාව සඳහා යොමු කරවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ළමුන් ව භාවනාව සඳහා සුදුසු ස්ථානයකට රැගෙන යන්න.
- මේසයට සුදු රෙද්දක් එළා ඒ මත ශුද්ධ බයිබලය (උත්පත්ති 1/26-27) පෙරළා සිංහාසනාරූඪ කරන්න. (දේව වාක්‍යාසනයේ තබන ආකාරයට)
- ශුද්ධ බයිබලය ඉදිරියෙන් පොල්තෙල් පහනක් තබා එය දල්වන්න.
- සිසුන් ව භාවනා කරන ස්ථානයෙන් පිටත පේළියට පෙළගස්වන්න.
- පසු ව සිසුන් ''දෙවි සමිඳුන් අප හට දුන් තිළිණයකි මේ ජීවිතේ'' යන ගීතිකාව ගයමින්, ගෞරවයෙන් පෙළට ගොස්, ශුද්ධ බයිබලයට නමස්කාර කර, පන්ති කාමරය තුළ අඩකවයක ආකාරයට පහසු ඉරියව්වකින් අසුන් ගැනීමට සලස්වන්න.
- ගීතිකාව අවසානයේ ගුරුවරයා විසින් උත්පත්ති 1/26-27 පාඨය කියවා, සුළු මොහොතක් නිහඬව සිට, ශුද්ධ බයිබලය ඉහළට ඔසවා, ''දේව වාක්‍යය එසේ ය'' යනුවෙන් පවසා, එය සිඹ, අදාළ ස්ථානයේ තැන්පත් කරන්න.

අනතුරු ව සිසුන් සියලු දෙනාව ම පහත පියවරයන් ඔස්සේ කෙටි භාවනාවකට යොමු කරවන්න.

- අපි සියලු දෙනා ම දෑස් වසා ගනිමු. අවටින් ඇසෙන ශබ්දවලට සවන් යොමු කරමු.
- අපට ඉතා ම ළඟින් ඇසෙන ශබ්ද වලට සවන් දෙමු.
- දැන් අප ආශ්වාස ප්‍රාශ්වාස කරන ආකාරය වෙත අවධානය යොමු කරමු.
- අප හුස්ම ඉහළට ගන්නා විට මනසින් ''ජේසු'' යනුවෙන් ආමන්ත්‍රණය කරමු.
- අප හුස්ම පහළට හෙළන විට නරක ගුණාංග අප තුළින් බැහැර කරන බවත් සිතමු. (කිහිපවරක් මෙසේ කරන්න.)
- ඉන්පසු කෙටි මෙනෙහි කිරීමකට යොමුවන්න.

- දේව ස්වරූපයට අනුව තමා තමා ව දකින්නේ කෙසේ ද?
- තමා තමාව අගය කරනවාද? ''ඔව් '' ඇයි? - '' නැත'' ඇයි?

- තමාගේ හොඳ ගතිපැවතුම් සිහියට නගා ගන්න.
- තමාගේ නරක ගතිපැවතුම් සිහියට නගා ගන්න.
- නරක ගතිපැවතුම්වලින් මිදීමට තීරණය (අදිටන්) කර ගන්න.
- දේව තාත්තා හැම කෙනෙකුට ම නොයෙකුත් හැකියා දක්ෂතා දී තිබෙනවා. එවැනි කිසිඳු හැකියාවක් නැති කිසි කෙනෙකු අප අතර නැහැ. නමුත් බොහෝ විට සිදු වන්නේ අප තුළ ඇති හැකියාවන් මොනවාද'යි සොයා නොබැලීමයි. ඒවා දියුණු කර ගැනීමට උත්සාහයක් නොගැනීමයි.

අපට දී තිබෙන විවිධ දීමනා ලැබී ඇත්තේ තමන්ට ගෞරවය ලැබීමටවත් ආත්මාර්ථකාමී ලෙස තමාගේ ප්‍රයෝජනය සඳහා පමණක් යොදා ගැනීමට නොවෙයි. දෙවියන් වහන්සේ ලෝකය මවා එය පූර්ණත්වයට ගෙන ඒමට අපට බාර දුන් සේක. එම කාර්යය සඳහා ඔවුන් වහන්සේ අපට බොහෝ හැකියාවන් මෙන් ම දැනුම හා ඥානය දුන් සේක.

තවත් සමහරු තමන්ට ලැබී ඇති දැනුම හා හැකියාවන් වැඩි දියුණු කර නොගනිති. තමන්ගේ ලස්සන කාලය, ළමා වයස නැති නාස්ති කර ගනිති. එය අප අතින් දේව තාත්තාට, අපේ සහොදර සහෝදරියන්ට මෙන් ම අපට කර ගන්නා වැරැද්දකි. අප යමක් කරද්දී අසාර්ථක විය හැකි ය. උදාහරණයක් ලෙස, විභාගය අසමත් විය හැකි ය. නමුත් ඒ ගැන කලකිරීමට පත් නොවී නැවත නැවත නැගිටිමන් ඉදිරියට යා යුතුයි. එවිට, අපගේ ජීවිතයේ අරමුණ කරා යා හැකි වෙයි. ඔබගේ ජීවිතයේ හොඳම මිතුරා ජේසු කර ගන්න.

ආදර ජේසුනී, මට මගේ අඩුපාඩු මකා ගනිමින්, නිර්භීත ව ඉදිරියට යන්නටත්, පරාජය හා වැරදීම් ගැන නොතකා, ඔබ වහන්සේ තුළ ජීවිතය ගොඩ නගන්නටත් ශුද්ධාත්ම බලය මට ලබා දුන මැනව. ආමෙන්, ජේසු!

- දැන් අපට ජීවය දුන් දෙවි පියාණන් වහන්සේට අපගේ ආදරය ප්‍රකාශ කරමු.
- හුස්ම ඉහළට ගැනීම → ''ජේසු'' යනුවෙන් ආමන්ත්‍රණය කිරීම
- හුස්ම පහළට හෙළීම → නරක සිතුවිලි අප තුළින් බැහැර වන බව සිතීම
- අපට ඉතා ම ළඟින් ඇසෙන ශබ්දවලට සවන් දෙමු.
- අප අවටින් ඇසෙන ශබ්දවලට සවන් යොමු කරමු.
- දැන් සෙමින් දෑස් විවර කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය, සුදු රෙද්දක්, පොල්තෙල් පහනක්, පීරිසියක්, කිතුනු ගී පොත

(දෙවි සමිඳුන් අපහට දුන් තිළිණයකි මේ ජීවිතේ)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගෙදර පරිසරයෙන් :**

නිවසේ දී ශුද්ධ බයිබලය පදනම් කරගෙන භාවනා කරන්න.

**පරිගණක වදන් සැකසුම :** මංගලිකා විජේරත්න මහත්මිය
කළමනාකරණ සහකාර 1
ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහය**

**කාර්යාලීය කටයුතු :** එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය
කළමනාකරණ සහකාර
ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා
කාර්යාල ආධාරක
ජාතික අධ්‍යාපන ආයතනය

ගාමිණී රෝහණ විමලසේන මහතා
කාර්යාල ආධාරක
ජාතික අධ්‍යාපන ආයතනය